**ලංකා විදුලිබල මණ්ඩලය - 2018**
**------------------------------------**

## 1.1 තත්ත්වාගණනය කළ මතය
**------------------------------**

ලංකා විදුලිබල මණ්ඩලයේ සහ එහි පරිපාලිත සමාගම්වල 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශන සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශන සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ලංකා විදුලිබල මණ්ඩලයේ (“ලංවිම”) මූල්‍ය ප්‍රකාශන හා ලංකා විදුලිබල මණ්ඩලයේ හා එහි පරිපාලිත සමාගම්වල ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන (“සමූහය”) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. සීමාසහිත ලංකා කෝල් (පුද්ගලික) සමාගම සහ ශ්‍රී ලංකා එනර්ජීස් (පුද්ගලික) සමාගම හැර අනෙකුත් පරිපාලිතයන්හි මූල්‍ය ප්‍රකාශන අදාළ පරිපාලිතයන්හි අධ්‍යක්ෂ මණ්ඩලය හා මා විසින් පත් කරන ලද ප්‍රසිද්ධ වෘත්තියෙහි නියැලි වරලත් ගණකාධිකාරී සමාගම් විසින් විගණනය කරන ලද අතර සීමාසහිත ලංකා කෝල් (පුද්ගලික) සමාගමේ සහ ශ්‍රී ලංකා එනර්ජීස් (පුද්ගලික) සමාගමේ මූල්‍ය ප්‍රකාශන මා විසින් විගණනය කරන ලදි. මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, 2018 දෙසැම්බර් 31 දින වන විට මණ්ඩලයේ හා සමූහයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

## 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම
**----------------------------------------------**

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්
**----------------------------------------------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සමූහය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය සමූහය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම, සමූහයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

මණ්ඩලයේ හා සමූහයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, සමූහයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය කෙරේ.

### 1.4 විගණන විෂය පථය

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.
මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදි. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මගින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස සමූහයේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සමූහයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදි. ප්‍රමාණවත් අවිනිශ්චිතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතු වේ. මාගේ නිගමනයන් විගණකගේ වාර්තාවේ දිනය දක්වා ලබා ගන්නා ලද විගණන සාක්ෂි මත පදනම් වේ. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත සමූහයේ අඛණ්ඩ පැවැත්ම අවසන් විය හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යූහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ මණ්ඩලයේ හා සමූහයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත්

ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ මණ්ඩලයේ හා සමූහයේ පාලක මණ්ඩල විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, මණ්ඩලය හා සමූහය ක්‍රියා කර ඇති බව,
- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව මණ්ඩලය හා සමූහය කටයුතු කර ඇති බව,
- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව මණ්ඩලය හා සමූහය ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන

### 1.5.1 ඒකාබද්ධ කිරීම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| පහත දැක්වෙන නිරීක්ෂණ මත පදනම්ව 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පහත සඳහන් සමාගම්වල මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් තත්ත්වාගණන කළ මතයක් ප්‍රකාශ කරන ලදි. | | |
| **(අ) ලංකා කෝල් (පුද්) සමාගම** | | |
| (i) 2016 සැප්තැම්බර් 19 සිට 2018 අප්‍රේල් 09 දක්වා කාල පරිච්ඡේදය තුළ ගල් අඟුරු ආනයනය පිළිබඳ නිවැරදි ගනුදෙනු වටිනාකම ප්‍රකාශ නොකිරීම හේතුවෙන් ශ්‍රී ලංකා රේගුව විසින් සමාගමට රු.205,000,000 ක දඩයක් පනවා තිබුණු අතර අධ්‍යක්ෂවරුන් විසින් ගිණුම් අත්සන් කිරීමට පෙර 2018 දෙසැම්බර් 12 දින දඩ මුදල තීරණය කර තිබුණි. කෙසේ වුවද, සමාලෝචිත වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශනවල අසම්භාව්‍ය බැරකම සඳහා ප්‍රතිපාදනයක් කර නොතිබුණි. | මෙය අසම්භාව්‍ය වගකීමක් ලෙස හඳුනාගෙන ඇති අතර වෙන්කිරීම ලබා නොදීමට හේතු දක්වමින් ලංකා කෝල් සමාගමෙහි මූල්‍ය ප්‍රකාශනයේ සටහන 25 යටතේ අවශ්‍ය අනාවරණය කර ඇත. | මූල්‍ය ප්‍රකාශනයේ අසම්භාව්‍ය වගකීම් සඳහා වෙන්කිරීම හෝ අනාවරණය කිරීම කළ යුතුය. |

| | | |
|---|---|---|
| (ii) බදු වාර්තාවේ දැක්වෙන ආර්ථික සේවා ගාස්තු බැරකම හා 2018 දෙසැම්බර් 31 දිනට සමාගමේ මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන බැරකම අතර රු.100,327,636 ක වෙනසක් නිරීක්ෂණය විය. | මෙය ලංකා කෝල් සමාගම විසින් එකතු කළ අගය මත බදු ඉන්වොයිසි නිකුත් කිරීමේදී ප්‍රමාදය හේතුවෙන් සිදු වූ නොසැලකිලිමත් ඌන ප්‍රතිපාදනයකි. සේවා සපයන්නන්ගෙන් අක්‍රමික බිල් ලැබීම්/ ලැබීම් ප්‍රතිපූර්ණය හේතුවෙන් මෙම ප්‍රමාදය ඇති වී තිබේ. දැනට සමස්තයක් ලෙස 2018 වර්ෂය සඳහා ඉන්වොයිසි නිකුත් කර ඇති බැවින් 2019 වර්ෂයේ දී ඌන ප්‍රතිපාදනය සඳහා ලංකා කෝල් සමාගම විසින් සටහන් කරනු ලැබේ. | නියමිත කාල පරිච්ඡේදයට වගකීම් හඳුනා ගැනීමට අභ්‍යන්තර පාලනය ශක්තිමත් කළ යුතුය. |
| (iii) ගල් අඟුරු ආනයනය කිරීමේදී, තථ්‍ය වශයෙන් වැය නොදරන ලද, රේගු කටයුතු සඳහා වටිනාකම තහවුරු කිරීමේදී මතිමාත්‍ර ගැලපීමක් ලෙස රේගුවේදී සියයට 10 ක ලාභයක් වටිනාකමට එකතු කර තිබුණි. කෙසේ වුවද රු.3,723,718,278 ක් වූ එම සියයට 10 ක ලාභය ආදායමට එකතු කර පසුව සමාගම විසින් ණයගැතියාට වට්ටමක් ලෙස එම මුදල ලබාදී විකුණුම් පිරිවැයට අයකර තිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස සමාන මුදලකින් විකුණුම් පිරිවැය හා ආදායම වැඩියෙන් දක්වා තිබුණි. | ලංවිම සඳහා එකතු කළ අගය මත බදු ඉන්වොයිසි නිකුත් කිරීමේදී පිරිවැයට රේගු ආන්තිකයක් එකතු කිරීම සඳහා ලංකා කෝල් සමාගම විසින් නියෝගයක් ලබා දී තිබුණි. 2018 ජුනි 28 දින අමාත්‍යාංශයේදී, දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ (IRD) නිලධාරියෙකුගේ සහභාගීත්වය සහිතව පවත්වන ලද රැස්වීමේදී මෙම මිල යාන්ත්‍රණය පිළිගෙන ඇත. දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ නිලධාරියා විසින් ලංවිම සඳහා ඉන්වොයිසි මත වැට් සඳහා කෝල් සමාගමේ මූලික වටිනාකම රේගු කාර්යයන් සඳහා වටිනාකමට අඩු නොවිය යුතු බවට වාර්තා කර සටහන් කර තිබුණි. එබැවින් 10% හුදෙක්ම දේශීය ආදායම් දෙපාර්තමේන්තු නිලධාරියා විසින් ගත් නියෝගය මත එකතු කරන ලද්දකි. ඉන්පසු ලංවිම එම නියෝගය අභියෝග කළ අතර 2018.09.07 දිනැති ලිපියෙන් දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට ලියා දන්වා ඇත. ලංවිම ලිපියට දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ ප්‍රතිචාරය අපේක්ෂාවෙන් සිටී. එම අවස්ථාවේ සිට ඉන්වොයිසිය සඳහා රේගු ආන්තිකයට 10% එක් කිරීම අප විසින් සිදු කරන අතර, දේශීය ආදායම් දෙපාර්තමේන්තුව අවසන් නොවූ අතුරු නියමය (ruling) නිකුත් කිරීමේදී දේශීය ආදායම් | මෙම මුදල විකුණුම් සහ ප්‍රවර්ධන වියදම් ලෙස පෙන්විය යුතුය. |

| | | |
|---|---|---|
| | දෙපාර්තමේන්තුව සඳහා කිසිඳු අතිරේක එකතු කළ අගය මත නිමවුම් බදු (output VAT) ප්‍රේෂණය නොකෙරේ. එබැවින් දෘශ්‍ය ආදායම් වැඩිපුර දැක්වීම සඳහා හේතු විය. | |
| (iv) සීමාසහිත ලංකා නැව් සංස්ථාව (CSCL) මඟින් සීමාසහිත ටෝරියන් අයන් ඇන්ඩ් ස්ටීල් සමාගමෙන් (TISCL) ගල් අඟුරු අඩුවෙන් සැපයීමට අදාළව ලැබිය යුතු රු.539,192,079 ක් අයකර ගැනීමට වසර 6 ක් ඉක්මවා තිබුණද එකඟ වූ නිරවුල් කිරීමේ ක්‍රමයකින් අයකර ගැනීමට නොහැකි වී තිබූ අතර හානිකරණය සඳහා ප්‍රතිපාදනයක්ද කර නොතිබුණි. | ඉහළ මට්ටමේ කමිටුවක් විසින් ටෝරියන් අයන් සහ ස්ටීල් නිරවුල් කිරීම මෙහෙයුම් කරන ලදි. එම ණය බොල් ණය බවට කමිටුව විසින් මතයක් දක්වා නොතිබූ අතර එසේම ගැනුම්කරු ද ගල් අඟුරු සැපයීමෙන් ලැබිය යුතු මුදල් නිරවුල් කිරීමට අදහස් කරන ලදි. අපගේ දැනගැනීම අනුව, නිරවුල් කිරීමේ යෝජනාව තීරණය ගැනීම සඳහා අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කර ඇත.<br>සීමාසහිත ලංකා නැව් සංස්ථාවට අනුව අමාත්‍ය මණ්ඩල තීරණය අපේක්ෂාවෙන් සිටී. ශේෂය අයකර ගත නොහැකි බවට සීමාසහිත ලංකා නැව් සංස්ථාව හෝ කමිටු වාර්තාව අදහස් දක්වා නැති අතර අනුගමනය කළ යුතු නිරවුල් කිරීමක් පිළිබඳ පොදු එකඟතාවයක් නොමැත. එබැවින් හානිකරණය සඳහා නිශ්චිත සාක්ෂි නොවිය. | හිඟ මුදල අය කර ගැනීමට කඩිනම් පියවර ගත යුතුය. |
| (v) පෙර වර්ෂ විගණනයේදී සත්‍යාපනය කළ නොහැකි වූ ඉදිරියට ගෙන එන ලද එකතුව රු.971,868 ක් වූ ලැබිය යුතු ආර්ථික සේවා ගාස්තු (ESC) හා ලැබිය යුතු රඳවුම් බදු (WHT) , රු.65,474,540 ක් වූ ගෙවිය යුතු ආදායම් බදු සහ රු.3,371,326 ක් වූ ලැබිය යුතු ජාතිය ගොඩනැඟීමේ බදු (NBT) සහ රු.12,758,801 ක් වූ ලැබිය යුතු එකතු කළ අගය මත බදු (VAT) පෙර වර්ෂ ගැලපීමක් ලෙස රඳවා ගත් ඉපැයුම් වලට එරෙහිව අයකර තිබුණි. කෙසේ වුවද පෙර කාල පරිච්ඡේදයන්හි දෝෂවල ස්වභාවය මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව්කර නොතිබුණි. | 2018 වර්ෂය සඳහා ලංකා කෝල් සමාගමේ මූල්‍ය ප්‍රකාශනවල ඉහත සඳහන් එක් එක් මුදල පිළිබඳව විස්තරාමක සටහන් (අංක 21, 23) සමාගම විසින් ලබා දී ඇත.<br><br><u>එකතු කළ අගය මත බදු</u><br>2017 වර්ෂය අවසානයට යෙදවුම් බදු ලැබිය යුතු ලෙස ගිණුම් ගත කර තිබුණු රු.12,758,801 ක් නිවැරදි තත්ත්වය නිරූපනය කිරීම සඳහා ගලපා තිබුණි. එකතු කළ අගය මත යෙදවුම් බදු ආපසු ලබාගැනීමේ හැකියාව පිළිබඳ ලංකා කෝල් සමාගම විසින් දේශීය ආදායම් දෙපාර්තමේන්තුවවෙන් විමසා තිබුණි. 2018.06.14 දිනැති දේශීය ආදායම් දෙපාර්තමේන්තු ලිපියෙන් 2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනතේ 22(5) | පූර්ව කාල දෝෂයේ ස්වභාවය මූල්‍ය ප්‍රකාශනවල හෙළි කළ යුතුය.<br>. |

වගන්තිය ප්‍රකාරව සමාගමක් විසින් ගෙවන ලද යෙදවුම් බදු, ආපසු නොගෙවන බව පැහැදිලි කර තිබුණි. ඒ අනුව 2018.07.26 දින පැවති රැස්වීමේදී ඉහත ලැබිය යුතු මුදල ගැලපීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබා ගෙන ගලපා තිබුණි.

**ජාතිය ගොඩනැගීමේ බදු**

සමාගම විසින් පෙර ගෙවන ලද ජාතිය ගොඩනැගීමේ බදු ලැබිය යුතු ලෙස ගිණුම් ගත කර තිබූ අතර 2017 අවසානයට එය රු.3,371,326 ක් විය. ආනයනකරුවකු ලෙස හා ගල් අඟුරු වෙළඳාම් කරන්නෙකු ලෙස ලංකා කෝල් සමාගම විසින් ගෙවන ලද ජාතිය ගොඩනැගීමේ බදු ආපසු ලබා ගැනීමට හිමිකම් නොලබයි. එබැවින්, ශේෂ පත්‍රයෙන් ඉහත ශේෂය ගැලපීම් කිරිමට 2018.07.26 දින පවත්වන ලද රැස්වීමේදී අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබාගෙන ඇත.

**ආදායම් බදු**

2014/2015 සහ 2013/2014 වර්ෂ සඳහා හිඟ ආදායම් බදු පිළිවෙලින් රු.2,049,484 ක් හා රු.3,590,678 ක් බව දේශීය ආදායම් දෙපාර්තමේන්තුව ලිඛිතව තහවුරු කර තිබුණි. එබැවින්, තවදුරටත් අවශ්‍ය නොවන රු.11,703,151 ක ගෙවිය යුතු බදු 2018.07.26 දින පැවති රැස්වීමේදී අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතියෙන් ගලපන ලදි.

ආදායම් බදු සඳහා රු.65,474,540 ක තවදුරටත් අතිරේක ප්‍රතිපාදනයක් කර තිබුණි. ඉහත කාරණය යොමු කර දේශීය ආදායම් දෙපාර්තමේන්තුවෙන් ලද ආදායම් බදු බැරකම පිළිබඳ ලිඛිත සනාථ කිරීමට අනුව මෙයද තවදුරටත් අවශ්‍ය නොවේ. එබැවින්, දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ ලිඛිත තහවුරු කිරීමට අනුව ගෙවිය යුතු වැඩිපුර ප්‍රතිපාදනය අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය මත ආපසු හරවා තිබුණි.

| | | | |
|---|---|---|---|
| | | **ආර්ථික සේවා ගාස්තු/ රැඳවුම් බදු** එකතුව රු.971,868 ක් වූ අයකර ගත නොහැකි ආර්ථික සේවා ගාස්තු හා රැඳවුම් බදු දිගු කාලයක් තහවුරු නොකරන ලද බදු ශේෂයන් ලියා හැරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයෙන් අනුමැතිය ලද තවත් කොටසකි. | |
| (vi) | මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන රු.12,241,774 ක් වූ ලංකා විදුලි බල මණ්ඩලය (ලංවිම) විසින් දැරිය යුතු ඉදිරියට ගෙන එන ලද ලැබිය යුතු ශේෂය අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතියද නොමැතිව රඳවාගත් ඉපැයුම් වලට අයකර තිබුණි. කෙසේ වුවද, තොරතුරු විගණනයට ඉදිරිපත් නොකළ බැවින්, ගිණුම්කරණ ක්‍රියාවලිය පිළිබඳ නිරවද්‍යතාවය පරීක්ෂා කළ නොහැකි විය. | දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් ලිඛිතව තහවුරු කර ඇති පරිදි 2014/2015 හා 2013/2014 වර්ෂ සඳහා ආදායම් බදු බැරකම පිළිවෙලින් රු.2,049,484 ක්, රු.3,590,678 ක් හැර දිගුකාලීන හිඟ බදු බැරකමක් නොමැත. එබැවින් ගෙවිය යුතු බදුවලට අදාළ නොවන ලංකා විදුලිබල මණ්ඩලයෙන් ඉහත ලැබිය යුතු ශේෂය ලියා හරින ලදි. | ගනුදෙනු සඳහා අභ්‍යන්තර පාලනය ශක්තිමත් කළ යුතු අතර ගනුදෙනු වල නිරවද්‍යතාවය සහතික කිරීම සඳහා සාක්ෂි තබා ගත යුතුය. . |
| (vii) | රු.8,896,850 ක් වූ ප්‍රතිපූර්ණ වියදම් මත ගෙවිය යුතු එකතු කළ අගය මත බදු පාලන ගිණුමේ ගිණුම්ගත කර නොතිබුණි. එබැවින් එකතු කළ අගය මත බදු බැරකම සමාන මුදලකින් අඩුවෙන් දක්වා තිබුණි. | විගණන විමසුම අනුව මේවා ලංකා කෝල් සමාගමට අයත් ප්‍රතිපූර්ණය කළ යුතු බිල්පත්‍රයන්ය. ලංකා කෝල් සමාගමේ සේවාවන් සඳහා ආන්තිකයක් එකතු කර නැත. බදු උපදේශකගේ උපදෙස් වන්නේ වියදම් ප්‍රතිපූර්ණය, එකතු කළ අගය මත බදු සඳහා වගකීමට යටත් නොවන බවයි. | සමාගමේ ප්‍රධාන ව්‍යාපාරය වන ප්‍රතිපූරණ වියදම් මත වැට් බදු ගෙවිය යුතුය. . |
| (viii) | ලංකා විදුලිබල මණ්ඩලය විසින් ගෙවන ලද බත්තල් ගාස්තු වලට අදාලව සීමාසහිත ලංකා නැව් සංස්ථාවට ගෙවිය යුතු රු.15,870,104 ක මුදලක් සීමාසහිත ලංකා නැව් සංස්ථාවට ගෙවා හෝ ලංකා විදුලිබල මණ්ඩලයෙන් ලැබුණු අත්තිකාරමක් ලෙස හෝ දක්වා නොතිබුණි. තවද ගාස්තුව නිරවුල් කිරීම සඳහා ලංකා විදුලිබල මණ්ඩලයෙන් සමාගම විසින් අරමුදල් ලබාගෙන තිබුණද සීමාසහිත ලංකා නැව් සංස්ථාවට ගෙවිය යුතු ඉහත කී බත්තල් ගාස්තු සමාගම විසින් ගිණුම්ගත කර නොතිබුණි. | ඉහත මුදල බත්තල් ගාස්තු පිළිබඳ එකතු කළ අගය මත බදුවලට අදාළ වන නමුත් බත්තල් සේවාව සඳහා ගාස්තුවල කොටසක් නොවේ. එකතු කළ අගය මත බදු සඳහා බත්තල් සේවාව වගකීමට බැඳෙන්නේ 0% ක් වශයෙන් බව දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද නියමය හේතුවෙන් ලංකා නැව් සංස්ථාවට ලංකා කෝල් සමාගම විසින් ඉහත මුදල ගෙවා නොමැත. මේ අතරතුර, සමාගමට රු.මිලියන 67.7 ක අතිරේක තක්සේරුවක් අංක 154 නැව් බඩු (shipment) දක්වා අය | සැබෑ වගකීම් පෙන්වීමට සමාගම නිවැරදි ගිණුම් වාර්තා පවත්වාගත යුතුය. |

| | | |
|---|---|---|
| | කරමින් අවසාන එකතු කළ අගය මත බදු තක්සේරුව රේගු දෙපාර්තමේන්තුව විසින් නිකුත් කර ඇත. රේගුව විසින් කිසිඳු අයකිරීමක් කිරීම වැලැක්වීමේ අරමුණින් අවසාන එකතු කළ අගය මත බදු තක්සේරුව අර්ධ නිරවුල් කිරීමක් ලෙස සිදු කිරීම සඳහා ඉහත ලදුපත යොදා ගන්නා ලදි. ලංකා කෝල් සමාගම විසින් මෙම නිරවුල් කිරීම නොකළේ නම් ගල් අඟුරු නැව් බඩු නිෂ්කාෂණය මත විය හැකි යටපත් කිරීමක් පිළිබඳ හැඟීමක් ඇතිවිය හැකිය. | |
| (ix)සීමාසහිත ලංකා නැව් සංස්ථාවෙන් නැව් ගත කිරීම් (Shipment) 154 දක්වා ලැබිය යුතු පැරණි රක්ෂණය රු.33,959,892 ක්, සීමාසහිත ලංකා නැව් සංස්ථාවට ගෙවිය යුතු රු.66,307,336 ක් වූ පැරණි ශේෂය, රු.18,075,801 ක්වූ විවිධ ණය ගැතියන්, රු.4,677,508 ක් වූ ලංකා විදුලිබල මණ්ඩලයෙන් ලැබිය යුතු මුදල් රු.1,760,500 ක් වූ ලංකා විදුලි බල මණ්ඩලයෙන් ලැබිය යුතු වෙනත් මුදල් හා රු.85,887,776 ක් වූ වෙළඳ ණයහිමියන් - සීමාසහිත නෝබල් රිසෝසස් ඉන්ටර්නැෂනල් පීටීඊ සමාගම් පිළිබඳ සත්‍යක්ෂණයට අදාළ ශේෂ සහතික කිරීම් හා සාක්ෂි විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි. | <u>රු.66,307,336 ක් වූ ලංකා නැව් සංස්ථාවට ගෙවිය යුතු පැරණි මුදල</u><br>පැරණි ලැබිය යුතු රක්ෂණ මුදල් හිලව් කිරීම සඳහා ලංකා නැව් සංස්ථාවට ගෙවිය යුතු මුදල හා රේගුවට වැඩිපුර ගෙවන ලද එකතු කළ අගය මත බදු අතිරේක මුදල පිළිවෙලින් රු.33,959,892 ක් රු.26,506,919 ක් වන අතර මෙම මුදල් ලංකා නැව් සංස්ථාවේ වගකීම් වේ.<br>පැරණි රක්ෂණය - ලංකා නැව් සංස්ථාව රු.33,959,892<br><br>ලංකා නැව් සංස්ථාව වෙත මෙම රක්ෂණ පිරිවැය අවශෝෂණය කර ගැනීම සඳහා සටහන් කරන ලද අතර නිරවුල් කිරීමට ලංකා නැව් සංස්ථා අධ්‍යක්ෂ කැමැත්ත පළකර තිබුණි. මෙය නැව් ගත කිරීම් අංක 79 සිට 154 දක්වා අදාළ වේ. පරීක්ෂා කිරීම සඳහා විෂය සටහන් ලබාගැනීමට ඇත.<br><br><u>විවිධ ණයගැතියන් රු.18,075,801</u><br>රේගුව සඳහා වැඩිපුර ගෙවීමකින් මුදල සමන්විත වන බව මූලික විමර්ශනවලින් අනාවරණය වී ඇත. තවදුරටත් විශ්ලේෂණය කරමින් පවතී. | වත්කම් හා වගකීම් වල පැවැත්ම සහතික කිරීම සඳහා විගණනය වෙත සාක්ෂි ඉදිරිපත් කල යුතුය. |

| | | |
|---|---|---|
| | <u>ලංවිම වෙතින් ලැබිය යුතු මුදල් රු.4,677,508</u><br>2017 වර්ෂයේදී ලංවිම සමඟ ගිණුම නිරවුල් කිරීමෙන් පසු මෙම මුදල ඉතිරිව ඇත. ප්‍රභවය/ ආරම්භය තහවුරු කරගැනීමට විමර්ශනය කරමින් පවතී.<br><br><u>ලංවිම වෙතින් වෙනත් ලැබිය යුතු මුදල් - රු.1,760,500</u><br>2017 වර්ෂයේදී ලංවිම සමඟ ගිණුම නිරවුල් කිරීමෙන් පසු මෙම මුදල ඉතිරිව ඇත. - ප්‍රභවය/ ආරම්භය තහවුරු කරගැනීමට විමර්ශනය කරමින් පවතී.<br><br><u>වෙළඳ ණයහිමියන් - නෝබල් රිසෝසස් - රු.85,887,776</u><br>ණයවර ලිපිය වලංගු වීම ඉකුත් වීම හේතුවෙන්, නෝබල් රිසෝසස් පුද්ගලික සමාගම විසින් මුදලෙන් කොටසක් අඩුවෙන් ලබා ගැනීමකි. | |
| (ආ) පහත සඳහන් කරුණු ඇතුළත්ව ප්‍රධාන වශයෙන් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම් පදනම් කර ගෙන සීමාසහිත ශ්‍රී ලංකා එනර්ජීස් (පුද්ගලික) සමාගමේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ තත්ත්වාගණනය කළ මතයක් මා විසින් නිකුත් කරන ලදි. | | |
| (i) සිහින් අළු (Fly ash ) සහ යබොර(Bottom Stag ) යොදා ගෙන සිමෙන්ති පාදක නිෂ්පාදන නිපදවීම හා විකිණීම සඳහා කම්හලක් ඉදිකිරීමට සමාගම විසින් සීමාසහිත ඇම්ට්‍රැඩ් හෝල්ඩින්ග්ස් (පුද්ගලික) සමාගම සමඟ බද්ධ ව්‍යාපාරයකට රු.7,364,447 ක මුදලක් 2014 දෙසැම්බර් 31 දිනට ආයෝජනය කර තිබුණු අතර පසුව බද්ධ ව්‍යාපාර ගිවිසුම අවසන් කර තිබුණි. ව්‍යාපාර හවුල්කරුවකු සොයා ගැනීමට නොහැකි වීම නිසා වත්කම් නිෂ්කාර්යව පැවතුණි. සමාගමේ | රු.මිලියන 7.3 ක් වටිනා ඇෂ් බ්‍රික් ව්‍යාපෘතියට කල මෙම ආයෝජනය දිගුකාලීනව එනර්ජීස් විගණන හා කළමනාකරණ කමිටුව විසින් අවධානය යොමු කළ අතර ඒ අනුව තක්සේරුවකින් පසුව මෙම ඉඩම හා ගොඩනැගිලි අත්පත් කරගන්නා ලෙස ලංවිම වෙත ලිපියක් නිකුත් කරන ලදි. ඒ අනුව ශ්‍රී ලංකා තක්සේරු දෙපාර්තමේන්තුව මඟින් ශ්‍රී ලංකා එනර්ජීස් වෙත තක්සේරුවක් ලබාගැනීමට හැකි වූ අතර 2019 මැයි 31 දිනැති තක්සේරු දෙපාර්තමේන්තුවේ ලිපියක් මඟින් රු.මිලියන 2.6 කට වටිනාකම තහවුරු කර තිබුණි. | මෙම ව්‍යාපෘතිය සඳහා කරන ලද ආයෝජනයට අදාළව හානිකරණ පාඩුව ගැළපිය යුතුය. |

| | | | |
|---|---|---|---|
| | අධ්‍යක්ෂ මණ්ඩලය විසින් වත්කම් ලංකා විදුලිබල මණ්ඩලයට භාරදීමට තීරණය කර උක්ත කරුණ සාමාන්‍යාධිකාරීට 2016 නොවැම්බර් 10 දින දන්වා තිබුණද, ලංකා විදුලිබල මණ්ඩලය විසින් 2019 ජුලි 15 දින වන විටත් වත්කම් භාර ගෙන නොතිබුණි. කෙසේ වුවද, මේ සම්බන්ධයෙන් දරන ලද පිරිවැය අයකර ගැනීම පිළිබඳව ප්‍රමාණවත් උචිත සාක්ෂි ලබා ගැනීමට මට නොහැකි වූ අතර ඉහත ව්‍යාපෘතියේ ආයෝජනය සම්බන්ධනේ සමූහය විසින් කිසිදු හානිකරණයක් සිදුකර නොතිබුණි. | මෙම වර්ෂයේදී හානිකරණ පාඩුව ගලපනු ලැබේ. | |
| (ii) | බැංකු ප්‍රකාශනය අනුව සමාලෝචිත වර්ෂය සඳහා කෙටි කාලීන ණය පොලිය හා දණ්ඩන ගාස්තු රු.14,410,173 ක් විය. කෙසේ වුවද, පොලිය හා දණ්ඩන ගාස්තු වශයෙන් රු.12,960,397 ක මුදලක් පමණක් වාර්තා කර තිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස සමාලෝචිත වර්ෂය සඳහා ලාභය රු.1,449,776 කින් වැඩියෙන් දක්වා තිබුණි. | මුළු මූල්‍ය වියදම් රු.15,744,485 ක් ලෙස දැක්වේ. ඉන් රු.12,836,150 ක මුදලක් ණය මුදල් මත පොලිය වන අතර ඉතිරි මුදල බැංකු ගාස්තු, කල් බදු පොලී සහ විනිමය පාඩුවලින් නිරූපනය වේ. | බැංකු ප්‍රකාශයේ විස්තර අනුව වාර්තා තබා ගත යුතුය. |
| (iii) | සමාගමේ කාර්ය මණ්ඩලය අනුබද්ධ සමාගම්වල පරිපාලන කටයුතු වල නිරත වී ඇති අතර සමාලෝචනයට භාජනය වූ වර්ෂය තුළදී, ඒ සඳහා දැරූ රු.21,556,883 ක මුදලක් ප්‍රතිපූරණය නොකර සමාගමේ කාර්ය මණ්ඩල පරිපාලන වියදම් ලෙස සලකා තිබුණි. | වර්ෂය තුළ පරිපාලිතයන් විසින් ප්‍රමාණවත් අධිකයක් උත්පාදනය නොකරන ලද හෙයින් කළමනාකරණ ගාස්තු අයකිරීමේ ප්‍රතිපත්තියට බලපෑමක් වී නොතිබුණි. ශ්‍රී ලංකා එනර්ජීස් විසින් මෙම සංකල්පය 2019 වර්ෂය සිට අනුගමනය කරනු ඇත. | සමාගම විසින් උප සමාගම් වෙනුවෙන් දරනු ලබන වියදම් ප්‍රතිපූරණය කළ යුතුය. |
| (iv) | විලම්බිත බදු වත්කම්, ස්ථාවර තැන්පතු, ආදායම් බදු ප්‍රතිපාදන හා විශ්‍රාම ප්‍රතිලාභ වගකීම් සඳහා සටහන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි. | හිටපු අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ගන්නා ලද තීරණයක් මත පදනම්ව ශ්‍රී ලංකා එනර්ජීස් හි ආදායම් බදු හා විලම්බිත බදු ගණනය කිරීම් ස්වාධීන විගණන ආයතනයකට භාර දී තිබුණි. කාල රාමුව සීමා වීම | භාවිතා කරන්නන් සඳහා මූල්‍ය ප්‍රකාශන අවබෝධ කර ගැනීම සඳහා විලම්බිත බදු වත්කම්, ස්ථාවර |

| | | |
|---|---|---|
| | හේතුවෙන් එකී ස්වාධීන ගණනය කිරීම ලැබීමට පෙර 2018 වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන අවසන් කර තිබූ අතර රු.875,214 ක ප්‍රතිපාදනයක් පමණක් අවසන් මූල්‍ය ප්‍රකාශනවල ප්‍රතිපාදනයක් ලෙස ඇතුළත් කරන ලදි. දැනට එම ස්වාධීන ගණනය කිරීම ලැබී ඇති අතර එය නිම කිරීමේ කාර්යය ශ්‍රී ලංකා එනර්ජීස් විසින් සිදුකරනු ලැබේ. | තැන්පතු, ආදායම් බදු ප්‍රතිපාදන සහ විශ්‍රාම ප්‍රතිලාභ වගකීම් සඳහා මූල්‍ය ප්‍රකාශයේ සටහන් ලබා දිය යුතුය. |
| (v) ශේෂය රු.704,076 ක්, රු.797,264 ක්, රු.1,193,739 ක්, රු.466,223 ක් හා රු.4,312,917 ක් වූ පිළිවෙලින් වෙනත් ලැබිය යුතු ශේෂ, අත්තිකාරම් හා පෙර ගෙවුම්, උපචිත වියදම්, විශ්‍රාම ප්‍රතිලාභ වගකීම් හා කල් බදු ණයහිමියන් සඳහා අදාළ ප්‍රමාණවත් සාක්ෂි සමාගම විසින් ඉදිරිපත් කර නොතිබුණි. එබැවින්, එම ශේෂ පිළිබඳ නිරවද්‍යතාවය පරීක්ෂා කිරීමට විගණනයේදී නොහැකි විය. | කෙටුම්පත් මතය සඳහා පිළිතුර සමඟ ඉහත ශේෂයන් විගණනයට ඉදිරිපත් කරන ලදි. මෙම ලැබිය යුතු පොලී ඉතා දිගු කාලීන ශේෂයක් වන අතර එය ලියාහැරිය යුතුය. ඒ සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ශ්‍රී ලංකා එනර්ජීස් විසින් අපේක්ෂා කරනු ලැබේ. | විගණන තත්ත්වාගණනයන් වළක්වා ගැනීම සඳහා විගණකවරුන්ට වෙනත් ලැබිය යුතු, අත්තිකාරම් සහ පෙරගෙවුම්, උපචිත වියදම්, විශ්‍රාම ප්‍රතිලාභ වගකීම් සහ කල්බදු ණය හිමියන් සඳහා සමාගම ප්‍රමාණවත් සුදුසු සාක්ෂි සැපයිය යුතුය. |

### 1.5.2 සංවිධානයේ අඛණ්ඩ පැවැත්ම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සීමාසහිත ත්‍රිකුණාමලය විදුලිබල සමාගමේ (TPCL) විගණක විසින් එහි මූල්‍ය ප්‍රකාශන පිළිබඳව පහත කරුණ අවධාරණය කර තිබුණි. | | |
| සාම්පූර්හි මෙගාවොට් 500 ක ගල් අඟුරු ව්‍යාපෘතියක් සංවර්ධනය කිරීමේ හුදු අරමුණු සහිතව මෙහෙයුම් කරන ලද සමාගම එම විදුලිබල පිරියතෙහි සංවර්ධන කාර්යයන් නවත්වා ඇති අතර පෙර ප්‍රාග්ධනීත කරන ලද වියදම් සමාලෝචිත වර්ෂය තුළ ලියා හැර තිබුණි. සාම්පූර්හි ගල් අඟුරු විදුලිබල පිරියත ඉදිකිරීම වෙනුවට සීමාසහිත ත්‍රිකුණාමලය විදුලිබල සමාගම | සාම්පූර්හි යෝජිත ගල් අඟුරු විදුලිබල ව්‍යාපෘතිය ලෙස මෙගාවොට් 50 ක සූර්යබල ශක්ති ව්‍යාපෘතියක් සංවර්ධනය කිරීම සඳහා හා ශ්‍රී ලංකා බටහිර වෙරළේ මෙගාවොට් 500 ක එල්එන්ජී විදුලිබල ව්‍යාපෘතියක් සංවර්ධනය කිරීමට අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී තිබුණි. මෙගාවොට් 500 ක එල්එන්ජී විදුලිබල ව්‍යාපෘතිය භාරගැනීම සඳහා ආයෝජන | විදුලිබල හිඟය සහ හදිසි විදුලි මිලදී ගැනීම් අවම කිරීම සඳහා නව යෝජනා ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පියවර ගත යුතුය. |

| | | |
|---|---|---|
| (TPCL) විසින් මෙගාවොට් 50 ක සූර්ය විදුලි බල පිරියතක් එම ඉඩමෙහිම ඉදිකිරීම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී තිබුණි. තවද, කෙරවළපිටිය මෙගාවොට් 500 ක එල්එන්ජී විදුලිබල පිරියතක් සංවර්ධනය කිරීම සඳහාද අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා දී තිබුණි. කෙසේ වුවද ඉහත විදුලිබල පිරියතයන් සංවර්ධනය පිළිබඳ කිසිදු සංවර්ධන කාර්යයක් සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් සිදුකර නොතිබුණි. ඒ අනුව, සමාගම අඛණ්ඩව පවත්වා ගෙන යාමේ හැකියාව පිළිබඳ සැලකිය යුතු අන්දමේ සැකයක් ඇති කරවන ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් එයින් නිරූපණය විය. | මණ්ඩලයේ උපදෙස් මත විදුලිබල, බලශක්ති හා ව්‍යාපාර සංවර්ධන අමාත්‍යාංශයේ ලේකම්ගෙන් නියෝගයක් ලැබී තිබුණි. එල්එන්ජී විදුලිබල ව්‍යාපෘතිය සඳහා බද්ධ ව්‍යාපාර කොටස් හිමි ගිවිසුමක් (JVSHA) 2019.10.25 දින අත්සන් කරන ලදි.<br><br>සූර්යබල විදුලිබල ව්‍යාපෘතිය සඳහා බද්ධ ව්‍යාපාර කොටස් හිමි (JVSHA) ගිවිසුම සකස් කිරීමේදී, ඉහත JVSHA ගිවිසුම සඳහා අවශ්‍ය වෙනස්කම් කිරීමට ලංවිම, NTPC සමාගම හා ත්‍රිකුණාමලය TPCL සමාගම කලින් තීරණය කරන ලදි. 2019.12.31 දිනට පෙර සූර්ය විදුලිබල ව්‍යාපෘතිය පිළිබඳ JVSHA ගිවිසුම අත්සන් කිරීමට බද්ධ ව්‍යාපාර හවුල්කරුවන් (ලංවිම සහ NTPC ඉන්දියා සමාගම) අවශ්‍ය පියවරයන් ගනු ඇතැයි අපේක්ෂා කෙරේ.<br>ව්‍යාපෘති මූලික කාර්යයන් සංවර්ධනය වෙනුවෙන් සූර්ය බලශක්ති ව්‍යාපෘතිය සඳහා JVSHA ගිවිසුම අත්සන් කිරීම මත අරමුදල් ඇතුළත් කර ගැනීම සිදුකළ යුතු බව 2019.06.28 දින පැවති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී තීරණය කරන ලදි. | |

**1.5.3 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම**

| අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) **LKAS 2- ඉන්වෙන්ට්‍රි සහ LKAS 16 - දේපල, යන්ත්‍ර හා උපකරණ**<br>ලංකා විදුලිබල මණ්ඩලය විසින් එහි ප්‍රාග්ධන හා නඩත්තු කාර්යයන් වෙනුවෙන් ශ්‍රමය, ද්‍රව්‍ය හා පොදු කාර්ය පිරිවැය අගය කිරීම සඳහා ඉහත ප්‍රමිතිවල විධිවිධාන ප්‍රකාරව තථ්‍ය පිරිවැය යොදා ගනු වෙනුවට ප්‍රමිත පිරිවැය ක්‍රමය යොදා ගනු ලැබේ. එහි ප්‍රතිඵලයක් ලෙස එකතුව | කෙරීගෙන යන වැඩවලින් මාරු කරන ලද බෙදාහැරීම් අංශයේ වත්කම් හැර අනෙකුත් සියලු දේපල, පිරියත හා උපකරණ (ඉඩම්, ගොඩනැගිලි, මෝටර් වාහන, යන්ත්‍රෝපකරණ හා කාර්යාල උපකරණ) තථ්‍ය පිරිවැයට අගය කරන අතර එය ශ්‍රී | තොගය තක්සේරු කිරීමේදී තථ්‍ය පිරිවැය හෝ ආසන්න පිරිවැය පදනම යොදා ගත යුතුය. |

රු.5,532,199,136 ක් වූ හිතකර මිල විචලනය සහ ශ්‍රම හා පොදු කාර්ය ඊේට විචලනයන් සහ ඒ නිසා ඇති වූ අහිත කර ගබඩා මිල විචලනය රු.1,356,322,492 ක් මූල්‍ය ප්‍රකාශනවල ගිණුම්ගත කර තිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස ප්‍රාග්ධන කාර්යයන්ට අදාළ ඉහළ මූල්‍ය සම්බන්ධය හේතුවෙන් ලංකා විදුලි බල මණ්ඩලයේ මෙහෙයුම් ප්‍රතිඵල, වත්කම් වගකීම් සහ ස්කන්ධය කෙරෙහි සැලකිය යුතු බලපෑමක් ඇති වී තිබුණි. කෙසේ වුවද එම ප්‍රාග්ධන කාර්යයන්ට අදාළ තොරතුරු නොමැතිවීම හේතුවෙන් එයින් මූල්‍ය ප්‍රකාශන වලට වන බලපෑම විගණනයේදී නිශ්චය කළ නොහැකි විය.

ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල වේ.

ශ්‍රී ලං ගි ප්‍ර 2 – “ඉන්වෙන්ට්‍රි පිරිවැය ගණනය කිරීම සඳහා වන ශිල්පීය ක්‍රම, එනම් ප්‍රමිත පිරිවැය ක්‍රමය හෝ සිල්ලර ක්‍රමය ප්‍රතිඵලය පිරිවැයට ආසන්න වන්නේ නම් පහසුව සඳහා යොදා ගනු ලැබේ. ” ලංකා විදුලිබල මණ්ඩලය විසින් ඉන්වෙන්ට්‍රි අගය කිරීම සඳහා ප්‍රමිත පිරිවැය යොදාගැනීමේ හේතුව වන්නේ ද්‍රව්‍යවල මිල වෙනස්වීම් නොසලකා ඕනෑම ප්‍රදේශයක සිටින ගනුදෙනුකරුවකුට ප්‍රමිත පිරිවැය පදනමක් තිබිය යුතු වීමයි. තවද, ප්‍රයෝගිකව තථ්‍ය පිරිවැය යොදා ගැනීමට දුෂ්කර අවස්ථාවන් වන රැහැන් ඉදිකිරීම හා වෙනත් ව්‍යාපාර කාර්යයන් සඳහා ඉන්වෙන්ට්‍රි අයිතම විශාල ප්‍රමාණයක් යොදා ගනු ලැබේ. ශ්‍රම ඊේටය තථ්‍ය සාමාන්‍ය සෘජු ශ්‍රම පිරිවැය පදනම්ව ගණනය කරනු ලබන අතර එය ප්‍රාග්ධන හා නඩත්තු කාර්යයන් සඳහා අවශෝෂණය කරනු ලැබේ. අදාළ ප්‍රාග්ධන හෝ නඩත්තු කාර්යයන් සඳහා අදාළ වන සෘජුවම ආරෝපණය කළ හැකි පොදු කාර්ය පිරිවැය යොදා ගනිමින් පොදු කාර්ය ඊේටය ගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා මහජන උපයෝගීතා කොමිෂන් සභාවේ මාර්ගෝපදේශ මගින්ද “අයකිරීම් සඳහා ක්‍රමවේදය ” මෙසේ නිර්වචනය කර ඇත. එක් එක් බලපත්‍රලාභියා විසින් මෙහෙයුම් ප්‍රදේශවල විදුලිබලය සැපයීම් සේවා ලබා දීම සඳහා යොදා ගන්නා සියලුම ද්‍රව්‍ය විෂයයන් සඳහා ප්‍රමිත මිල ගණනය කළ යුතුය. එසේ ගණනය කරන ලද ප්‍රමිත මිල ඕනෑම වර්ෂයක ජනවාරි 01 දිනෙන් ආරම්භව දෙසැම්බර් 31 දක්වා වන කාලපරිච්ඡේදයක් සඳහා වලංගු විය යුතුය.

බෙදාහැරීම් අංශවල අධික කාර්ය ප්‍රමාණය හේතුවෙන් ප්‍රාග්ධන කාර්යයන් හා නඩත්තු කාර්යයන්ට අදාළ මිල විචලනයන් බෙදීයාම සඳහා වර්තමාන ක්‍රමය ආධාරක නොවේ. යෝජිත ව්‍යවසායකත්ව සම්පත් සැලසුම් (Enterprises Resource Plan System) පද්ධතිය සඳහා ක්‍රියාවලිය අධ්‍යයනයේදී මෙම ගැටලුව මතුකර දක්වා සාකච්ඡා කර ඇත. ඉදිරියේදී එම පද්ධතිය ක්‍රියාත්මක කිරිමත් සමඟ මෙම ගැටලුව සඳහා විසඳුමක් සොයා ගැනීමට පියවර ගනු ලැබේ.

ඉන්වෙන්ට්‍රි අගය කිරිම සඳහා වඩාත් යෝග්‍ය ක්‍රමය අධ්‍යයනය කිරීම සඳහා පත්කරන ලද කමිටුව විසින් "බර තැබූ සාමාන්‍ය මිල ක්‍රමය" යොදා ගැනීම සඳහා නිර්දේශ කරන ලදි. මේ අතර ලංවිම විසින් බර තැබූ සාමාන්‍ය ඉන්වෙන්ට්‍රි අගය කිරීම් ක්‍රමය සමඟ ERP ක්‍රමය ක්‍රියාත්මක කිරීමේ ක්‍රියාමාර්ග සකස් කරමින් ඇත. ලංවිම සඳහා ව්‍යවසායකත්ව සම්පත් සැලසුම් (ERP) පද්ධතිය හඳුන්වා දීමත් සමඟ මෙම ගැටලු ඉවත් වී යනු ඇත.

තවද, ERP පද්ධතිය ක්‍රියාත්මක වන තෙක් තථ්‍ය මිල හා ප්‍රමිත මිල අතර පරතරය තවදුරටත් අවම කිරීමේ අරමුණින් ප්‍රමිත මිල අර්ධ වාර්ෂිකව සමාලෝචනය කිරීම සඳහා කමිටුව විසින් යෝජනා කරන ලදි.

2019 සිට බලපැවැත්වෙන පරිදි බෙදාහැරීම් අංශ 4 හි මූල්‍ය ප්‍රකාශන වලින් ශ්‍රම රේට විචලනය ඉවත් කිරීමට කටයුතු කර තිබුණි. ඒ අනුවම ක්‍රියාත්මක කිරීම සඳහා අනෙකුත් බෙදාහැරීම් අංශ තුනට පැවරීම් කරන ලදි.

(ආ) **LKAS 8 - ගිණුම්කරණ ප්‍රතිපත්ති, ගිණුම්කරණ ඇස්තමේන්තු වල වෙනස්වීම් සහ දෝෂ**

| | | |
|---|---|---|
| (i) ලංකා විදුලිබල මණ්ඩලයේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ස්ථිර ප්‍රතිපත්තිමය තීරණයක් ගැනීමෙන් තොරව අතිරේක සාමාන්‍යාධිකාරී (උත්පාදන) විසින් දෙන ලද උපදෙස් ප්‍රකාරව රු.302,590,349 ක් හා රු.2,375,852,430 ක් වටිනා අමතර කොටස් පිළිවෙලින් මෙහෙයුම් වියදම් හා ප්‍රාග්ධන වියදම් යටතේ ගිණුම්ගත කර තිබුණි. එබැවින්, එවැනි වර්ගීකරණයක් සඳහා යොදා ගත් පදනම පිළිබඳ සාධාරණත්වය විගණනයේදී පිළිගැනීමට නොහැකි විය. තවද වර්ගීකරණය සඳහා යොදා ගන්නා ලද පදනම මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි. | "උත්පාදන අංශයේ අමතර කොටස් - ප්‍රාග්ධන වියදම හා මෙහෙයුම් වියදම වෙන්කිරීම" පිළිබඳ 2018 සැප්තැම්බර් 17 දිනැති අංක GHQ/AGM(G)/ Circular/2018/01 දරන චක්‍රලේඛය 2019 ජනවාරි 01 දින සිට බලපැවැත්වෙන පරිදි නිකුත් කරන ලදි. මෙම චක්‍රලේඛයට අනුගත වෙමින් 2019 ජනවාරි 01 දින සිට බලපැවැත්වෙන පරිදි ගනුදෙනු වාර්තා කිරීම සඳහා කටයුතු කරන ලදි. | GHQ / AGM (G) / Circular / 2018/01 අංක චක්‍රලේඛයට අනුකූලව ගනුදෙනු සටහන් කළ යුතුය. |
| (ii) ලංකා විදුලිබල මණ්ඩලය විසින් අඛණ්ඩව තවදුරටත් භාවිතයට ගනු ලබන සම්පූර්ණයෙන් ක්ෂය කරන ලද, ජංගම නොවන වත්කම් වල ඵලදායී ජීව කාලය ගිණුම්කරණ ප්‍රතිපත්තිවල දක්වා ඇති පරිදි සමාලෝචනය කර නොතිබුණි. උදාහරණයක් වශයෙන් පිරිවැය රු.32,241,176,427 ක් හා රු.1,848,341,889 ක් වූ පිළිවෙලින් සම්පූර්ණයෙන් ක්ෂය කරන ලද බලාගාර 4 ක් සහ මෝටර් වාහන 1,116 ක සංඛ්‍යාවක් තථ්‍ය ජීව කාලය ඇස්තමේන්තු කිරීමකින් තොරව තවදුරටත් භාවිතයට ගනිමින් පැවතුණි. | විදුලිබල පිරියත වැනි උත්පාදන අංශයේ ජංගම නොවන වත්කම් ස්වභාවයෙන් අනන්‍ය හා සංකීර්ණ වන අතර වත්කම්වල ජීව කාලය/ තක්සේරුව, යළි තක්සේරු කිරීම සඳහා නිශ්චිත ආයතනයක්/ මාර්ගෝපදේශ නොමැත. මෙම ගැටලුව තවදුරටත් අධ්‍යයනය කරනු ලැබේ.<br>ප්‍රතිපත්තිය අධ්‍යයනය කිරීම සඳහා හා ක්‍රියාවලිය සුසංවිධිත කිරීම (streamline) සඳහා කමිටුවක් පත් කිරීමට කටයුතු කරනු ලැබේ. | ලංවිම විසින් අඛණ්ඩව භාවිතා කරනු ලබන පූර්ණ ක්ෂය වී ඇති ජංගම නොවන වත්කම්වල ප්‍රයෝජනවත් ආයු කාලය ගිණුම්කරණ ප්‍රතිපත්තිවල සඳහන් පරිදි සමාලෝචනය කළ යුතුය. |

| | | |
|---|---|---|
| **(ඇ) LKAS 16 - දේපල, යන්ත්‍ර සහ උපකරණ** | | |
| සම්ප්‍රේෂණ අංශයේ රු.170,908,049,775 ක් වූ ස්ථාවර වත්කම් සමාලෝචිත වර්ෂය තුළ භෞතිකව පරීක්ෂා කර නොතිබුණි. | සම්ප්‍රේෂණ අංශයේ ස්ථාවර වත්කම් භෞතිකව සත්‍යාපනය කිරීමට පියවර ගෙන ඇත. | LKAS 16 අනුව සෑම වසරකම ස්ථාවර වත්කම් භෞතිකව සත්‍යාපනය කළ යුතුය. |
| **(ඇ)LKAS 27- වෙන් කිරීම්, අවිනිශ්චිත වගකීම් සහ අවිනිශ්චිත වත්කම්** | | |
| මණ්ඩලයේ සේවක අර්ථ සාධක අරමුදල (EPF) මඟින් මූල්‍ය උපකරණවල ආයෝජනය කර තිබූ රු.2,312,756,993 ක් එම උපකරණවල නොපැවැත්ම හේතුවෙන් අයකර ගැනීම සැක සහිතය. ලංකා විදුලිබල මණ්ඩලය සේවක අර්ථ සාධක අරමුදලේ පාලන බලය පැවරුණු භාරකරු වන බැවින් අසම්භාව්‍යයන් සඳහා (තිබේ නම්) අවසාන වගකීම මණ්ඩලයට පැවරේ. කෙසේ වුවද මෙම අසම්භාව්‍ය බැරකම සම්බන්ධයෙන් කිසිදු ප්‍රතිපාදනයක් හෝ හෙළිදරව් කිරීමක් මූල්‍ය ප්‍රකාශනවල සිදුකර නොතිබුණි. | වාර්තාකරණ අස්ථිත්වය සඳහා වූ සංකල්පිත ව්‍යුහයේ 3.10 ඡේදය ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සඳහා අවශ්‍ය වන හෝ තෝරා ගන්නා අස්ථිත්වය වාර්තාකරණ අස්ථිත්වයයි. ඒ අනුව ලංවිම අර්ථසාධක අරමුදල යනු අර්ථසාධක අරමුදලේ රීති මඟින් (ගැසට් අංක 1321/18-2003-12-31) කළමනාකරණය කෙරෙන වෙන් වූ අස්ථිත්වයකි. අරමුදලේ වෙනම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සඳහා අර්ථසාධක අරමුදල් රීති මඟින් අවශ්‍ය වේ.<br><br>තවද, අර්ථසාධක අරමුදල් රීතිවල 21(ii) වගන්තිය ප්‍රකාරව, "එක් එක් මුදල් වර්ෂය අවසානයේ අරමුදලේ ගිණුම්, කමිටුව විසින් සකස් කර එය අධ්‍යක්ෂ මණ්ඩලයට ඉදිරිපත් කළ යුතුය. එසේ පිළියෙල කරන ලද අරමුදලේ ගිණුම්වල, අරමුදලේ විගණකවරුන්ගේ උපදෙස් සහිතව කමිටුව විසින් එම සංචිත ඇති කිරීම හා සුදුසු යැයි හැඟෙන එම ප්‍රතිපාදන සිදු කිරීම කරනු ලැබේ." එබැවින් අසම්භාව්‍යයන් (තිබේ නම්) සඳහා අවසාන වගකීම අරමුදල සතු වේ. ඒ අනුව, මෙම අසම්භාව්‍යයන් සම්බන්ධයෙන් අරමුදලේ මූල්‍ය ප්‍රකාශනවල අවශ්‍ය හෙළිදරව් කිරීම් සිදු කරන ලදී. | මෙම අසම්භාව්‍ය වගකීම සම්බන්ධයෙන් මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශනවල වෙන්කිරීම් හෝ අනාවරණය කිරීම කළ යුතුය. |

(ඉ) **LKAS 38 - අස්පෘශ්‍ය වත්කම්**

| | | |
|---|---|---|
| මෘදුකාංගය මිලදී ගැනීමට හා සංවර්ධනය කිරීමට වැය කරන ලද රු.56,281,125 ක මුදල ප්‍රමිතියේ අවශ්‍යතාවය ප්‍රකාරව අස්පෘශ්‍ය වත්කම් ලෙස හඳුනාගෙන ගිණුම්කරණ ප්‍රතිපත්තිවල හෙළිදරව් කර නොතිබුණි. | ප්‍රමිතයේ අවශ්‍යතාවය ප්‍රකාරව මෘදුකාංග අස්පෘශ්‍ය වත්කම් ලෙස වාර්තා කිරීමට කටයුතු කරන ලද අතර මූල්‍ය ප්‍රකාශනවල අවශ්‍ය හෙළිදරව් කිරීම් සිදු කරනු ලැබේ. | මිලදී ගත් හා සංවර්ධනය කරන ලද මෘදුකාංග ප්‍රමිතියේ අවශ්‍යතාවය අනුව අස්පෘශ්‍ය වත්කම් ලෙස හඳුනාගත යුතු අතර ගිණුම්කරණ ප්‍රතිපත්තිවල අනාවරණය කළ යුතුය. |

### 1.5.4 ගිණුම්කරණ අඩුපාඩු

| | | |
|---|---|---|
| (අ) ලංකා විදුලි බල මණ්ඩලයේ විශ්‍රාම වැටුප් අරමුදල මඟින් කරන ලද රු.403,717,966 ක ආයෝජනයන් සහ ඒ සඳහා රු.16,045,328 ක් වූ පොලිය එම මූල්‍ය උපකරණවල නොපැවැත්ම හේතුවෙන් අයකර ගැනීම සැකසහිතය. කෙසේ වුවද, සමාලෝචිත වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශනවල මේ සම්බන්ධයෙන් කිසිඳු ගැලපීමක් හෝ ප්‍රතිපාදනයක් කර නොතිබුණි. | මුහුණත අගය හා ඒ සඳහා පැහැර හරින ලද කූපන් පොලී ගෙවීම් අයකර ගැනීම සඳහා එන්ට්‍රස්ට් සිකියුරිටීස් පීඑල්සී ආයතනයට එරෙහිව ලංකා විදුලි බල මණ්ඩලය විසින් නඩු අංක DMR/1029/2018 යටතේ කොළඹ දිස්ත්‍රික් අධිකරණයේ සිවිල් නඩුවක් ගොනු කර තිබුණි. සිතාසි සඳහා නඩුව නියම කර තිබූ අතර, ඊළඟ නඩු වාරය 2019 ඔක්තෝබර් 01 දිනයට නියම කර තිබුණි.<br><br>තවද, ශ්‍රී ලංකා මහ බැංකුව සමඟ සමථයකට පැමිණීමේ සැලැස්මකට සාකච්ඡා කරමින් සිටින අතර එහිදී පැහැර හරින ලද කූපන් ගෙවීම් සමඟ ආයෝජන මුදලින් 50% ක් ආපසු ගෙවීමට හා ඉතිරි මුදල සමාන වාරික 04 කින් නිරවුල් කිරීමට ශ්‍රී ලංකා මහ බැංකුව විසින් යෝජනා කර තිබුණි. එකී යෝජනාවට ප්‍රතිචාරයක් ලෙස 2017 ඔක්තෝබර් 4 දිනැති ලංවිම සභාපති ඩබ්ලිව්.බී.ගනේගල මයාගේ ලිපියෙන් මුළු ආයෝජනයෙන් යම් නොගෙවූ වටිනාකමක් අයකර ගැනීමට එන්ට්‍රස්ට් සිකියුරිටීස් පීඑල්සී ආයතනයට එරෙහිව නෛතික කටයුත්තක් ආරම්භ කිරීම සඳහා ලංවිම ට ඇති අයිතිය පිළිබඳ පූර්ව විනිශ්චයක් නොමැතිව එකී | මේ සම්බන්ධයෙන් මූල්‍ය ප්‍රකාශනවල වෙන්කිරීම් කළ යුතුය. |

| | | |
|---|---|---|
| | යෝජනාවට ලංවීම කැමැත්ත ප්‍රකාශ කරන ලදි. එකී ලිපියෙන් පසුව, එම ලිපිවලට ප්‍රතිචාර වශයෙන් පූර්වෝක්ත නිරවුල් කිරීමේ සැලැස්ම පිළිබඳ වර්තමාන තත්ත්වය විමසීම් සඳහා සිහි කැඳවීම් කිහිපයක් යවා ඇති අතර ශ්‍රී ලංකා මහ බැංකුව විසින් එම යෝජිත නිරවුල් කිරීමේ සැලැස්මට අනුමැතිය ලබාගැනීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය වෙත යොමු කර ඇති බව සඳහන් කර ඇත. | |
| (ආ) රු. 1,410,889,819 ක හර ශේෂයක් (තොග ඌනතාවය ) සහ රු.39,522,766 ක බැර ශේෂයක් (තොග අතිරික්තය ) වර්ෂ 1 කට වැඩි කාලයක් නිරවුල් කිරීමෙන් තොරව තොග ගැලපීම් ගිණුමේ පැවතුණි. | තොග ගැළපුම් වලට අදාළ නෛතික කටයුතු යටතේ පවතින වංචා, ඌණතා නිරවුල් කිරීමට අදාළ අංශ විසින් පියවර ගෙන ඇත.<br>යාවත්කාලීන කිරීම් ඇමුණුම් 01 හි දක්වා ඇත. | කෙටි කාලයක් ඇතුළත තොග අතිරික්තය හා ඌනතාවයන් ඉවත් කිරීමට පියවර ගත යුතුය. |
| (ඇ) අංක 10/2434/423/034 දරන අමාත්‍ය මණ්ඩල තීරණය ප්‍රකාරව, ලක් විජය විදුලි බලාගාරය ඉදිකිරීම සඳහා ලබාගත් රු.159,184,187,965 ක ණය මුදල සහ ඒ සඳහා පොලිය ලංකා විදුලිබල මණ්ඩලය විසින් මහා භාණ්ඩාගාරයට ආපසු ගෙවිය යුතුය. කෙසේ වුවද, මහා භාණ්ඩාගාරයේ විදේශ සම්පත් දෙපාර්තමේන්තුව විසින් ණය ප්‍රදාන බැංකුවට සමාලෝචිත වර්ෂයේ රු.3,281,749,986 ක මුදලක් හා 2017 දෙසැම්බර් 31 දක්වා එම ණය සඳහා පොලිය වශයෙන් රු.21,966,051,905 ක් ගෙවා තිබුණද, ලංකා විදුලි බල මණ්ඩලය විසින් ඉහත ගෙවීම් සිදුකර නොතිබු අතර ඒ සඳහා ගිණුම්වල ප්‍රතිපාදනයන් හෝ සිදුකර නොතිබුණි. එබැවින්, සමාලෝචිත වර්ෂය සඳහා පාඩුව සහ 2018 දෙසැම්බර් 31 දිනට රඳවා ගත් ඉපැයුම් පිළිවෙලින් | ලංකා විදුලිබල මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශනවල ප්‍රධාන කාර්යසාධන දර්ශක පිළිබඳ ප්‍රතිඵලය සැලකිල්ලට ගැනීම මගින් 2018 ජූලි 11 දින පැවති රැස්වීමේදී මහා භාණ්ඩාගාරය විසින් ලක්විජය විදුලිබල පිරියතෙහි මුළු ණය ප්‍රමාණය ශ්‍රී ලංකා රජයේ ස්කන්ධයට පරිවර්තනය කිරීම සඳහා තීරණයක් ගන්නා ලදි. ඒ සඳහා 2018 වර්ෂයට රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවට අයවැය ප්‍රතිපාදන සලසා නොතිබූ බැවින් මහා භාණ්ඩාගාරයට එය නීත්‍යානුකූල කිරීමට නොහැකි වී තිබුණි. කෙසේ වුවද, 2019 වර්ෂය තුළදී චීන එක්සිම් බැංකුවට මහා භාණ්ඩාගාරය විසින් ගෙවන ලද රු.20,499,241,722.25 ක ආපසු ගෙවීම් හා පොලී මුදල් ස්කන්ධය සඳහා පරිවර්තනය කිරීමට කටයුතු කරන ලදි.<br><br>භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවෙන් ලිඛිත නියෝගයක් ලැබුණු විට ලංවීම | භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවෙන් ලිඛිත උපදෙස් ලැබීමෙන් පසු ලංවීම පොත් වල ගැලපීමට හෝ හිඟ මුදල් ගෙවීමට අවශ්‍ය පියවර ගත යුතුය. |

| | | |
|---|---|---|
| රු.3,281,749,986 කින් හා රු.25,247,801,891 කින් අඩුවෙන් දක්වා තිබුණි. | පොත්වල එය ගැලපීම් කිරීම සඳහා ලංවිම විසින් කටයුතු කරනු ලැබේ. | |
| (ඇ) ලංකා විදුලිබල මණ්ඩලය විසින් පවත්වා ගෙන යනු ලබන සේවක අර්ථ සාධක අරමුදල වෙනුවෙන් ලංකා විදුලිබල මණ්ඩලය විසින් දරන ලද රු.41,421,524 ක් වූ වියදම් ලැබිය යුතු මුදල් ලෙස සලකනු වෙනුවට ලංකා විදුලිබල මණ්ඩලයේ වියදම් ලෙස සලකා තිබුණි. එබැවින් සමාලෝචිත වර්ෂය සඳහා පාඩුව එම මුදලින් වැඩියෙන් දක්වා තිබුණි. | 2003 දෙසැම්බර් 31 දිනැති අංක 1321/18 දරන සාමාන්‍ය ගැසට් නිවේදනය යටතේ පළ කරන ලද අර්ථසාධක අරමුදල් රීති වල 20 (i) වගන්තිය අනුව, ආයෝජන මිලදී ගැනීම් හා විකිණීම් සඳහා ඍජුව ආරෝපණය කළ හැකි වියදම් ඇතුළත්ව අර්ථසාධක අරමුදල් කළමනාකරණය හා පරිපාලනය පිළිබඳ වියදම්, වරින්වර අධ්‍යක්ෂ මණ්ඩලය විසින් තීරණය කර නොමැත්තේ නම් මණ්ඩලයේ අරමුදල් සඳහා අයකිරීම් කළ යුතුය.<br>එබැවින් ලං වි ම අර්ථසාධක අරමුදලට අදාළ රු.41,421,524.00 ක වියදම් ලංවිම මූල්‍ය ප්‍රකාශනවලට ඇතුළත් කිරීම ඉහත කී ලංවිම අර්ථසාධක අරමුදල් රීතිවලට අනුකූල වීමකි. එබැවින් අර්ථසාධක අරමුදල් වියදම් ලංවිම මූල්‍ය ප්‍රකාශනවල ලැබිය යුතු මුදල් ලෙස වාර්තා කිරීම අවශ්‍ය නොවේ. | ලංවිම සේවක අර්ථසාධක අරමුදල් රීති සංශෝධනය කළ යුතු අතර අරමුදලේ පරිපාලනය සඳහා ලංවිම විසින් දරන ලද වියදම් අය කර ගැනීමට පියවර ගත යුතුය. |
| (ඉ) ලංවිම විසින් 2013 වර්ෂයට පෙර කාල පරිච්ඡේදය සඳහා රජයේ ආයතන වලට විදුලි ජනක යන්ත්‍ර, විදුලි සෝපාන හා වායු සමීකරණ යන්ත්‍ර සැපයීම නඩත්තු කිරීම සහ අලුත්වැඩියා කිරීම යන කාර්යයන් සිදුකිරීම, ඒවායේ ඉන්වොයිස් වටිනාකමට ගිණුම්ගත කරනු වෙනුවට පිරිවැයට අගය කර ඒ අනුව ගිණුම්ගත කර තිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ලැබිය යුතු මුදල් හා රඳවාගත් ඉපැයුම් රු.66,987,761 කින් අඩුවෙන් දක්වා තිබුණි. | ප්‍රධාන ඉංජිනේරු (විදුලිබල පිරියත), ප්‍රධාන ඉංජිනේරු (වායු සමීකරණ හා ශීතකරණ) සහ ප්‍රධාන ඉංජිනේරු (විදුලි සෝපාන) විසින් සිදුකරන වාර්ෂික නඩත්තු කාර්යයන්වලට අදාළව රජයේ ආයතන සඳහා ඉංජිනේරු ඇස්තමේන්තු වලට සේවා ලබාදීම නියෝජ්‍ය සාමාන්‍යාධිකාරීගේ (W&AS) විෂය පථය යටතට ගැනෙන ඒකකවලට අදාළ ප්‍රතිපත්තිය විය. වාර්ෂික නඩත්තු කාර්යයන් මත ලංවිම සඳහා අයවිය යුතු ගෙවීම් සිදු කිරීමට රජයේ ආයතන බොහෝ අකමැති හෙයින්, අදාළ රජයේ ආයතනවලින් ඇස්තමේන්තු වටිනාකම අයකරන තුරු ලංවිම විසින් දරන ලද තථ්‍ය පිරිවැය | 2013 වසරට පෙර රජයේ ආයතනවල විදුලි ජනක යන්ත්‍ර, සෝපාන සහ වායුසමීකරණ යන්ත්‍ර සැපයීම, නඩත්තු කිරීම සහ අළුත්වැඩියා කිරීම සඳහා ලංවිම විසින් කරන ලද කාර්යයන් ඉන්වොයිස් වටිනාකම්වලින් අගය කළ යුතු අතර ඒවා ගිණුම් ගත යුතුය. |

වාර්තා කරනු ලැබේ. එහි ප්‍රතිඵලයක් ලෙස ලංවිම විසින් එහි සේවා දායකයන් වෙනුවෙන් කරන ලද කාර්යයන් සඳහා කාර්තුමය පදනමක් මත ඉන්වොයිස් නිකුත් කිරීම 2015 වර්ෂයේ සිට ආරම්භ කර ඇත.

කෙසේ වුවද, ලංවිම විසින් 2005 වර්ෂය සිට හිඟහිටි අවම වශයෙන් දරන ලද පිරිවැය රජයේ ආයතනවලින් අයකර ගැනීමට නොකඩවා පරිශ්‍රමයන් දරා තිබුණද එය අසාර්ථක විය.

අවසානයේදී නීතිපතිවරයා දක්වා ඇති පරිදි (ඇමුණුම 2 බලන්න). ලැබිය යුතු මුදල් අයකර ගැනීම සඳහා රජයේ ආයතනවලට එරෙහිව නීතිමය කටයුතු ආරම්භ කිරීමට නොහැකි වීම හේතුවෙන් 2017 වර්ෂයේ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනයේ මේ සම්බන්ධයෙන් සම්පූර්ණ බොල් ණය ප්‍රතිපාදනයක් සිදු කරන ලදි.

විගණන වාර්තාවේ සඳහන් කර ඇති පරිදි පිරිවැය වෙනුවට එහි ඉන්වොයිස් වටිනාකමට 2018 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල පෙර ගනුදෙනු වාර්තා කිරීම (2013 ට පෙර) 2018 වර්ෂයේ ලැබිය යුතු මුදල් වලට සමානව සම්පූර්ණ ප්‍රතිපාදනයක් කිරීම් සඳහා ලැබිය යුතු හිඟ මුදල් සඳහා ප්‍රතිපාදන වැඩි වීම හේතුවෙන් 2013 වර්ෂයට පෙර කරන ලද ගනුදෙනු මාරු කිරීමෙන් පසුවත් මූල්‍ය ප්‍රකාශනවල ශුද්ධ ප්‍රතිඵලය සැලකිය යුතු තරම් නොවේ.

එබැවින්, මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ලැබිය යුතු මුදල් හා රඳවාගත් ඉපැයුම් රු.66,987,761 කින් අඩුවෙන් දැක්වීම යන ප්‍රකාශනය සමඟ එකඟවිය නොහැක.

| | | |
|---|---|---|
| (ඊ) 2016 වර්ෂයේ ගාස්තුවක් වශයෙන් (Levy ) මහා භාණ්ඩාගාරයට ගෙවන ලද රු.බිලියන 5 ක මුදලක් හිමිකම් ප්‍රකාශනයට අය කරනු වෙනුවට වෙනත් ණය ගැතියන් ලෙස දක්වා තිබුණි. | මේ සම්බන්ධයෙන් ලංවිම සාමාන්‍යාධිකාරී විසින් 2019.09.03 දිනැති අංක සීඊබී/එෆ්එම්/ජීඑන්/584 දරන ලිපියෙන් රාජ්‍ය ව්‍යාපාර අධ්‍යක්ෂ ජනරාල්ට පිටපතක් සහිතව අධ්‍යක්ෂ ජනරාල් (භාණ්ඩාගාර මෙහෙයුම්) වෙතින් පැහැදිලි කිරීමක් ඉල්ලා සිටින ලදි. රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් විසින් 2019.10.16 දිනැති ඔහුගේ අංක PED/I/CEB/2/11/iii දරන ලිපියෙන් රු.බිලියන 5 ක මුදල භාණ්ඩාගාරයට ගෙවන ලද කළමනාකරණ ගාස්තුවක් ලෙස දක්වා ඒ අනුව එම පිරිවැය පොත්වල ගිණුම්ගත කර වර්ෂ 10 ක කාලපරිච්ඡේදයකදී ක්‍රමක්ෂය කරන ලෙස උපදෙස් ලබා දී තිබුණි. (ඇමුණුම 02) | 2016 වර්ෂයේදී බදු ලෙස මහා භාණ්ඩාගාරයට ගෙවන ලද රු.බිලියන 5 ක මුදල හිමිකම් ප්‍රකාශයට අය කළ යුතුය. |
| (උ) ගල් අඟුරු මිලදී ගැනීම නාමමාත්‍ර ඉන්වොයිසි මත වාර්තා කිරීම හේතුවෙන් ලංකා කෝල් සමාගමේ ලැබිය යුතු ශේෂය හා මූල්‍ය ප්‍රකාශන වල ගෙවිය යුතු ශේෂය අතර රු.253,187,075 ක වෙනසක් නිරික්ෂණය විය. එහි ප්‍රතිඵලයක් ලෙස විකුණුම් පිරිවැය අඩුවෙන් දක්වා තිබූ අතර වර්ෂය සඳහා පාඩුව එම මුදලින් වැඩියෙන් දක්වා තිබුණි. | 2016 විගණන විමසුම මගින් (POE/C/CEB/FA/2016) මෙම කරුණ විමසා තිබූ අතර ලංකා කෝල් සමාගම විසින් අවසාන බදු ඉන්වොයිසි නිකුත් කරන තුරු නාමමාත්‍ර ඉන්වොයිසි වටිනාකම යොදාගැනීම සඳහා පාර්ශව දෙකම (ලංවිම/ ලංකා කෝල් සමාගම) එකඟ වී තිබුණි. එබැවින් 2017 දෙසැම්බර් 31 දිනට හිඟ ශේෂය ශුන්‍ය අගයක් වී තිබුණි. එහෙත් 2018 වර්ෂයේදී මෙම නිර්නායකය ලංකා කෝල් සමාගම විසින් තථ්‍ය ඉන්වොයිස් පදනම සඳහා වෙනස් කර තිබුණි. මෙම වෙනසට හේතුව වූයේ මෙම මාරු කිරීමයි. | වියදම්වල සත්‍ය වටිනාකම පිළිබඳ වාර්තා තබා ගත යුතු අතර දෙපාර්ශ්වයම එකම ගිණුම්කරණ ක්‍රමයක් භාවිතා කල යුතුය. |
| (ඌ) උප ණය ගිවිසුම්වල කොන්දේසි ප්‍රකාරව ලංවිම විසින් මහා භාණ්ඩාගාරයට ගෙවිය යුතු රු.2,557,474,111 ක පොලී මුදලක් ගෙවා හෝ ඒ සඳහා ප්‍රතිපාදනයක් සිදුකර නොතිබුණු අතර ඉහත පොලී ගෙවීම ප්‍රමාදවීම මත වර්ෂයකට සියයට 1 සිට සියයට 2 දක්වා වු | 2018 වර්ෂය සඳහා ලංකා විදුලිබල මණ්ඩලය හා මහා භාණ්ඩාගාරය අතර අත්සන් කරන ලද උප ණය ගිවිසුමේ වාර හා කොන්දේසි ප්‍රකාරව, ව්‍යාපෘති උප ණය මත භාණ්ඩාගාරයට ගෙවිය යුතු පොලී සඳහා ප්‍රතිපාදනය, රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ 2018 ජනවාරි 11 දින පවත්වන ලද රැස්වීමේදී | උප ණය ගිවිසුම්වල කොන්දේසිවලට අනුව මහා භාණ්ඩාගාරයට ගෙවිය යුතු පොලී සඳහා වෙන්කිරීම් කිරීම හෝ ගෙවීම් කිරීම කල යුතුය. |

අතිරේක පොලී මුදලක් ගෙවීමට සිදුවේ.

ගන්නා ලද තීරණය ප්‍රකාරව ලංවිම විසින් ගිණුම්ගත කර නොතිබුණි. 2015 මාර්තු 18 දින අමාත්‍ය මණ්ඩලය විසින් ගන්නා ලද තීරණය ප්‍රකාරව, ස්කන්ධයට මාරු කිරීම සිදු නොකරන ලද 2014 දෙසැම්බර් 31 දිනෙන් පසු මහා භාණ්ඩාගාරය මඟින් ලංවිම සඳහා කරන ලද සියලු උප ණය ස්කන්ධයට මාරු කිරීම සඳහා එකඟ වී තිබුණි.

පසුව, රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් සභාපතිත්වය දරන ලද 2019 ඔක්තෝබර් 03 දින පැවති රැස්වීමේදී මෙම කරුණ සාකච්ඡාවට ගන්නා ලද අතර ලංවිම පොත්වල තිබෙන හිඟ ණය සහ ස්කන්ධයට ණය පරිවර්තනය සඳහා ඒ පිළිබඳව ඇති ගැටලු විසඳීම සාකච්ඡා කරන ලදි. රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අයවැය ප්‍රතිපාදන නොමැතිවීම හේතුවෙන්, හිඟ ණය ස්කන්ධයට මාරු කිරීම පිළිබඳව විගණකාධිපතිවරයාගේ එකඟත්වය ලබා ගැනීම සඳහා තීරණය කරන ලදි. තවද, ඉහත උප ණය හැර අනෙකුත් සියලු ණය හා පුත්තලම ගල් අඟුරු පිරියත ණය හැර අනෙක් සියලු ණය හා ණය ක්‍රියාමාර්ග ලංවිම සඳහා ප්‍රදාන ලෙස සැලකීමට ද එකඟ විය.

ඒ අනුව, මහා භාණ්ඩාගාරය විසින් 2019 වර්ෂය සඳහා පුත්තලම ගල් අඟුරු විදුලිබල පිරියතෙහි රු.20,499,241,722.25 ණය ආපසු ගෙවීම් (වාරික හා පොලී) ශ්‍රී ලංකා රජයේ ස්කන්ධය ලෙස පරිවර්තනය කර ඇති අතර රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව විසින් හිඟ ණය සඳහා වූ අවශ්‍ය ගිණුම්කරණ ගැලපීම් ලංවිම පොත්වල සිදු කිරීමට ලංවිම වෙත දන්වා තිබුණි. (ඇමුණුම 03)

| | | |
|---|---|---|
| (එ) 2018 වර්ෂය සඳහා මොරගහකන්ද කුඩා විදුලිබල ව්‍යාපෘතියෙන් මිලදී ගන්නා ලද විදුලිබලය සඳහා වූ රු.432,223,807 ක මුදල සඳහා ලංකා විදුලිබල මණ්ඩලය විසින් ප්‍රතිපාදනයන් සිදු කර නොතිබුණි. එබැවින් වර්ෂය සඳහා පාඩුව එම මුදලින් අඩුවෙන් දක්වා තිබුණි. | සඳහන් කර ගතිමි. | ගනුදෙනු වාර්තා කිරීම නියමිත කාලය තුල සිදු කිරීම හඳුනා ගැනීම සඳහා අභ්‍යන්තර පාලනය වැඩිදියුණු කළ යුතුය. |
| (ඒ) විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ වාර්තාවලට අනුව, මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී ව්‍යාපෘති දෙකකට අදාළව සමාලෝචිත වර්ෂය තුළ කරන ලද රු.358,235,012 ක් වූ වියපැහැදමක් ගිණුම්වලට ගෙන නොතිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස කෙරීගෙන යන වැඩ හා වගකීම් සමාන මුදලකින් අඩුවෙන් දක්වා තිබුණි. | 2018 වර්ෂය තුළ වියපැහැදම් විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ ප්‍රකාශන පදනම්ව ගිණුම්ගත කර තිබුණි. කෙසේ වුවද, මෙම මුදල ගිණුම්කරණ කටයුතු සඳහා විදේශ සම්පත් දෙපාර්තමේන්තුවෙන් ලබාගත් ප්‍රකාශනයේ නොතිබීම හේතුවෙන් 2018 වර්ෂයේ ගිණුම්වලින් මඟ හැරී තිබුණි. මෙය පසුව සොයාගෙන තිබූ අතර වියපැහැදමක් ලෙස 2019 අගෝස්තු මාසයේදී ගිණුම්ගත කර ඇත.<br><br>**පිරිසිදු බලශක්ති හා ජාල කාර්යක්ෂමතා වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය - රු.12,800,693**<br>මෙම ව්‍යාපෘතිය, ව්‍යාපෘති අංශය හා බෙදාහැරීම් අංශ 02 විසින් ක්‍රියාත්මක කරනු ලබයි. ව්‍යාපෘති අංශයේ වාර්තාවලට අනුව, 2018 වර්ෂය සඳහා සියලු වියපැහැදම් ගිණුම්ගත කර ඇති බව තහවුරු වේ. | කෙරීගෙන යන වැඩ හඳුනා ගැනීමට, මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී සියලු වියපැහැදම් ගත යුතුය. |

### 1.5.5 නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) 2018 දෙසැම්බර් 31 දිනට ලංකා විදුලිබල මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන වල ලංකා ඛනිජ තෙල් සංස්ථාවට ගෙවිය යුතු ලෙස දැක්වෙන රු.46,029,135,981 ක ශේෂය හා එදිනට ලංකා ඛනිජ තෙල් සංස්ථාවේ මූල්‍ය ප්‍රකාශනවල | මෙම ගැටලුව නිරවුල් කිරීම සඳහා විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යාංශයේ විගණන කමිටුවට යොමු කර ඇත. | ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව සමඟ සාකච්ඡා කර මෙම ගැටළුව විසඳීමට පියවර ගත යුතුය. |

| | | |
|---|---|---|
| ලැබිය යුතු ලෙස දැක්වෙන රු.46,813,099,111 ක අනුරූපී ශේෂය අතර රු.783,963,130 ක වෙනසක් නිරීක්ෂණය විය. මේ සම්බන්ධයෙන් ලංකා විදුලිබල මණ්ඩලයේ සභාපති විසින් පහත සඳහන් පරිදි ප්‍රකාශයක් කර තිබුණි. "2013 සැප්තැම්බර් 30 දින භාණ්ඩාගාරයේ ලේකම්වරයා සභාපතිත්වය දරන ලද රැස්වීමේදී ගන්නා ලද තීරණය අනුව, 2013 අප්‍රේල් 20 දින සිට බලපැවැත්වෙන පරිදි කල් ඉක්ම වූ ඉන්වොයිසි වටිනාකම (ණය කාල පරිච්ඡේදයෙන් බැහැරව) මත පොලියක් ගෙවීමට තීරණය කරන ලදි. කෙසේ වුවද රු.753,610,829 ක් වූ ප්‍රමාද වූ පොලී ගෙවීම 2013 අප්‍රේල් 20 දිනට පෙර මිලදී ගත් ඉන්ධන සඳහා අදාළ වේ. එබැවින් ලංවිම විසින් මේ සඳහා වගකිව යුතු නොවන හෙයින් මෙම වෙනස සඳහා සැසඳීමක් අවශ්‍ය නොවේ.<br><br>මෙම කරුණ 2013 වර්ෂයේ සිට අඛණ්ඩව විගණන වාර්තාවල නැවත නැවත දක්වා තිබුණද, 2018 දෙසැම්බර් 31 වන විටත් නිරවුල් කර නොතිබුණි. | | |
| (ආ) බිල් කිරීම් පද්ධතියේ මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමහර ශේෂයන් මඟ හැරීම හේතුවෙන් 2018 දෙසැම්බර් 31 දිනට 01, 02, 03 හා 04 යන බෙදාහැරීම් අංශවල බිල් කිරීම් පද්ධතියේ දැක්වෙන තොග වෙළඳ ණය ගැති ශේෂයන් හා සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන වල දැක්වෙන අනුරූපී මුදල අතර එකතුව රු. 36,888,821 ක් වන නොසැසඳූ වෙනස්කම් නිරීක්ෂණය විය. | ලංවිම බිල් කිරීම් පද්ධතියේ බිල් කිරීමේ ගනුදෙනු සටහන් කිරීමේ ක්‍රියාවලිය සහ පොදු ලෙජරයේ මූල්‍ය ගනුදෙනු වාර්තා කිරීම යම් දිනයක සමාන නොවූ විට එවැනි වෙනස්කම් සඳහා හේතු තීරණය කර ගැනීමට බෙදාහැරීම් අංශ විසින් සැසඳීමක් කරනු ලැබේ.<br><br>විශාල සැපයුම් ණයගැති ලෙජර ශේෂයන්හි සක්‍රීය ණයගැතියන් හා අවසාන ණයගැතියන් අඩංගු වේ. කෙසේ වුවද, තොරතුරු තාක්ෂණ ශාඛාවෙන් උපුටා ගත් බිල් කිරීම් | සෑම මාසයකම ලෙජර ශේෂයන් පද්ධති ශේෂයන් සමඟ සැසඳීමට පියවර ගත යුතුය. |

| | | |
|---|---|---|
| | වාර්තාවේ සක්‍රිය ණයගැති ශේෂයන් පමණක් ඇතුළත් වේ. එබැවින් තොරතුරු තාක්ෂණ ශාඛාවෙන් උපුටාගත් බිල් කිරීම් වාර්තාවේ ශේෂය හා ලෙජර ශේෂය අතර වෙනසට ප්‍රධාන වශයෙන් අවසාන ණයගැතියන් හේතු වී ඇත. | |

**1.6** **අධිකාරී බලය නොලත් ගනුදෙනු**

| අධිකාරී බලය නොලත් ගනුදෙනු පිළිබඳ විස්තරය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) 2013 අංක 31 දරන ශ්‍රී ලංකා විදුලිබල(සංශෝධන) පනතේ 43 වන වගන්තියේ 4 සී (ii) වන උපවගන්තියේ අවශ්‍යතාවයට අනුව, ටෙන්ඩර් පටිපාටි අනුගමනය නොකර 2016 අප්‍රේල් සිට 2018 දෙසැම්බර් දක්වා කාලය තුළ හදිසි විදුලිබල මිලදී ගැනීම් (රු.මිලියන 39,555 ක් වටිනා ගිගාවොට් පැය 1,441) සිදු කර තිබුණි. | මෙම ප්‍රසම්පාදනය සඳහා කැබිනට් අනුමැතිය ලබාගෙන ඇත. | ස්වාධීන බලශක්ති නිෂ්පාදකයින්ගෙන් විදුලිය මිලදී ගැනීමේදී ටෙන්ඩර් පටිපාටිය අනුගමනය කළ යුතුය. |
| (ආ) අංක CA/WRIT/193/2015 දරන නඩුව යටතේ ලබාදෙන ලද අධිකරණ තීන්දුව අනුව, 2014 නොවැම්බර් 24 දිනැති අංක 2014/GM/46/Pers දරන චක්‍රලේඛය නීති විරෝධී, බල රහිත සහ වලංගු නැති චක්‍රලේඛයක් වේ. එබැවින් මෙම චක්‍රලේඛය හා ඒ මත නිකුත් කරන ලද අනෙකුත් චක්‍රලේඛ මත පදනම්ව වැටුප් ගෙවීම නීති විරෝධීය. විගණන නියැදි පරීක්ෂණයට අනුව, දීමනා, අතිකාල ගෙවීම් හා දෛනික දීමනා, ප්‍රසාද දීමනා, උපයන විට ගෙවීම් බදු, බදු මත බදු හා සේවක අර්ථ සාධක අරමුදල්, සේවක භාර අරමුදල් හා විශ්‍රාම වැටුප් ගෙවීම, ලබා නොගත් නිවාඩු මුදල් කර ගැනීම, වර්ධක වැටුප මත පදනම්ව ගෙවන ලද ණය මත පොලී ගෙවීම් පිළිබඳ බලපෑම් සැලකිල්ලට ගැනීමෙන් | එම මුදල 2015 - 2018 අතර ගෙවා ඇති බවත්, 2019 අප්‍රේල් 02 වන දින අධිකරණය විසින් තීන්දු ලබා දී ඇති බවත් විමසුමේ සඳහන් වේ. තීන්දුව ලැබීමෙන් පසු, 2019 අප්‍රේල් මාසයේ සිට බල පැවැත්වෙන පරිදි අදාළ සේවකයින්ගේ වැටුප් ලංවිම විසින් නවතා දමා ඇති අතර වැටුප් ගෙවීම සම්බන්ධයෙන් කැබිනට් අනුමැතිය ලබා ගන්නා තෙක් එම වැටුප වෙනුවට අයකර ගත හැකි පදනම මත දීමනාවක් ගෙවන ලදී.<br>තවද, ලංවිම එම තීන්දුව පිළිබඳ නීතිමය මතය ගරු නීතිපතිතුමගෙන් ඉල්ලා සිටින ලදි. ලංවිම විදුලිබල, බලශක්ති හා ව්‍යාපාර සංවර්ධන අමාත්‍යාංශය සමඟ සම්බන්ධව තීන්දුවට අනුකූලව කටයුතු කිරීමට අවශ්‍ය පියවර ගනිමින් සිටී. | ලංවිම අධිකරණ තීන්දු අනුගමනය කළ යුතුය. |

| | | |
|---|---|---|
| තොරව 2015 සිට 2018 දක්වා කාල පරිච්ඡේදය සඳහා දළ වශයෙන් රු.833,453,051 ක වැඩිපුර ගෙවීමක් සිදුකර තිබූ අතර මෙම වාර්තාවේ දිනය දක්වා එම වැඩිපුර ගෙවීම් සේවකයන්ගෙන් අයකර ගැනීම සඳහා කටයුතු කර නොතිබුණි. | | |
| (ඇ)2007 නොවැම්බර් 14 දින අමාත්‍ය මණ්ඩලය විසින් ගන්නා ලද තීරණයට හා 2009 මැයි 26 දිනැති අංක 39 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛයේ විධිවිධාන වලට පටහැනිව අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය මත ලංවිම කාර්ය මණ්ඩලයට වරින් වර විවිධ අන්දමේ සේවක දීමනා ගෙවා තිබුණි. 2018 වර්ෂයේ හා 2017 වර්ෂයේ පිළිවෙලින් එකතුව රු.මිලියන 1,873 ක් හා රු.මිලියන 1,930 ක් වූ එවැනි දීමනා ගෙවා තිබූ බව විගණන නියැදි පරීක්ෂණ වලදී අනාවරණය විය. | 2008-09-04 දින ලංවිම සේවකයින්ට වැටුප් හා සේවක කොමිෂන් සභාවේ නිර්දේශයන්ට අනුව දීමනා ගෙවීම සඳහා කැබිනට් අනුමැතිය ලැබී තිබේ. කෙසේ වෙතත්, මෙම අයිතමය යටතේ කුමන දීමනා යොමු කරන්නේද යන්න පැහැදිලි නැති බැවින් පුළුල් පිළිතුරක් ලබා ගත නොහැක. තවද, එම විමසුම සම්බන්ධයෙන් විගණකාධිපතිවරයාට පිළිතුරක් යවා ඇත. කළමනාකරණ සේවා චක්‍රලේඛ මණ්ඩලය විසින් සම්මත කර නොගන්නේ නම් සාමාන්‍යයෙන් ලංවිම තුළ භාවිතා නොවේ. කෙසේ වෙතත්, සෑම දීමනාවක්ම ගෙවීම සඳහා මණ්ඩලයේ අනුමැතිය ලබාගෙන ඇත. | කාර්ය මණ්ඩලයට දීමනා ගෙවීමේදී චක්‍රලේඛ අවශ්‍යතාවයන්ට අනුකූල විය යුතුය. |
| (ඈ) 1998 මාර්තු 08 දින අංක 130 දරණ පොදු ව්‍යාපාර චක්‍රලේඛයට අනුව සියයට 10 සිට 14 දක්වා පොලී අනුපාත යටතේ වාහන ණය ලබා දීම වෙනුවට ලංවිම සියයට 4.2 ක පොලී අනුපාතයකට මෙම ණය ලබා දී තිබුණි. තවද, ලංවිම දැඩි ද්‍රවශීලතා ගැටලුවලට මුහුණ දී සිටියද, කිසිදු පාලනයකින් තොරව කාර්ය මණ්ඩල ණය ගෙවා ඇති බව නිරීක්ෂණය විය. | සහන පොලී අනුපාත යටතේ මණ්ඩල තීරණ අනුව නියම කර ඇති නියමයන් හා කොන්දේසි අනුව ලංවිම සේවකයින් සඳහා වාහන ණය ලබා දෙන ලදි. තවද, මෙම මාතෘකාව යටතේ නිකුත් කරන ලද පොදු ව්‍යාපාර චක්‍රලේඛය ලංවිම විසින් සම්මත කර ගෙන නොමැත. තවද, ලංවිම සේවකයින්ට ප්‍රතිලාභයක් ලෙස කාර්ය මණ්ඩල ණය ගෙවා ඇත. එවැනි ප්‍රතිලාභ කළමනාකරණ යෝජනා ක්‍රමයක් නොමැතිව, ලංවිම සේවකයින්ගේ චිත්ත ධෛර්යය ඔවුන්ගේ කාර්යයන් කෙරෙහි පවත්වා ගත නොහැක. | කාර්ය මණ්ඩලයට දීමනා ගෙවීමේදී (ණය ලබාදීමේදී) ලංවිම චක්‍රලේඛ අවශ්‍යතාවයන්ට අනුකූල විය යුතුය. |

| | | |
|---|---|---|
| (ඉ) අංක 1321/182003 දරණ දෙසැම්බර් 31 දිනැති අති විශේෂ ගැසට් පත්‍රයෙන් ස්ථාපිත කර ඇති විශ්‍රාම වැටුප් අරමුදලේ රෙගුලාසි අංක 18 හි නියමයට අනුව සංශෝධිත නීති, නීතිගත නොකර මණ්ඩලය විසින් විශ්‍රාම වැටුප් ගෙවීම සහ අරමුදලට දක්වන දායකත්වය වැඩි කර ඇති අතර විශ්‍රාමිකයන් සඳහා වෛද්‍ය දීමනාවක් ද ක්‍රියාත්මක කර ඇත. එහි ප්‍රතිඵලයක් ලෙස මණ්ඩලයේ විශ්‍රාම වැටුප් වගකීම රු.මිලියන 2,939 කින් වැඩි වී ඇත. | 23.4 රීතියට අනුව, ලංවිමෙහි සේවකයින්ට වැටුප් වැඩි කරන අවස්ථාවේ දී මණ්ඩලය විසින් අනුමත කරන ලද විශ්‍රාම වැටුප් වැඩිවීමට අනුකූලව විශ්‍රාම වැටුප් සඳහා දීමනාව වැඩි කර තිබුණි. 2009 පෙබරවාරි 18 දිනැති කම්කරු කොමසාරිස් ජනරාල්ගේ එකඟතාවය සහිත ලිපිය මත විශ්‍රාම වැටුප් දායකත්වය 7% සිට 8% දක්වා 1% කින් ඉහළ නංවා ඇති අතර පසුව, 2008 නොවැම්බර් 11 දිනැති GM හි චක්‍රලේඛ අංකය 2008 / GM / 21 / FM මගින් සියලුම ගෙවීම් ඒකක ප්‍රධානීන්ට එය දැනුම් දෙන ලදි.<br><br>විශ්‍රාම වැටුප් අරමුදල් රීති 18 “රීති සංශෝධන” ප්‍රකාරව දේශීය ආදායම් කොමසාරිස් සහ කම්කරු කොමසාරිස්ගේ අවශ්‍ය අනුමැතිය ඇතිව, විශ්‍රාම අරමුදලේ කළමනාකරණ කමිටුව හරහා ඉදිරිපත් කරන ලද සංශෝධිත රෙගුලාසි යටතේ වෛද්‍ය යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීම, සභාපති විසින් පත් කරන ලද අනු කමිටුවේ නිර්දේශය මත මණ්ඩලය විසින් අනුමත කරන ලදි.<br><br>ලංවිම මණ්ඩලය විසින් අනුමත කරන ලද නීති රීති 2014 සැප්තැම්බර් 1 වන දින ගැසට් කිරීම සඳහා අමාත්‍යාංශයට යොමු කරන ලදි. විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යාංශයේ ලේකම් විසින් එවන ලද ලිපියට අදාළව 2017 ඔක්තෝබර් 16 වන දින දෙවන වරට අමාත්‍යාංශයට නැවත ඉදිරිපත් කරන ලද අතර 2013 සැප්තැම්බර් මස 11 වන දින සහ 2013 ඔක්තෝබර් 23 දින පැවති රැස්වීමේදී මණ්ඩලය විසින් අනුමත කරන ලද පරිදි විශ්‍රාම වැටුප් අරමුදලේ නීති රීති 2018 අගෝස්තු 13 වන දින සංශෝධනය කිරීමට මණ්ඩලය එකඟතාව ලබා දී ඇත. ඉන්පසු එය 2018 සැප්තැම්බර් 15 වන දින නැවත ගැසට් කිරීම සඳහා අමාත්‍යාංශයට යොමු කරන ලදි. | ලංවිම සඳහා වන අතිරේක පිරිවැය වළක්වා ගැනීම සඳහා යම් ගෙවීමක් කිරීමට පෙර ලංවිම අරමුදලේ නීති රීති සංශෝධනය කිරීම නීතිගත කළ යුතුය. |

## 1.7 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳ අභ්‍යන්තර පාලන

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| **(අ) වත්කම්කළමනාකරණය** | | |
| (i) බෙදාහැරීමේ අංශවල ප්‍රාග්ධන කටයුතු නිම කිරීමේ දීර්ඝ ප්‍රමාදය. | සම්පූරණ කරන ලද කාර්යයන් පැවරීමේ ක්‍රියාවලිය අදාළ පළාත් නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිවරුන් සහ අතිරේක සාමාන්‍යාධිකාරිවරුන් විසින් ඔවුන්ගේ විධායක කණ්ඩායම් රැස්වීම්වල නිරන්තර අධීක්ෂණ කටයුත්තකි. | සම්පූර්ණ කරන ලද කාර්යයන් වහාම මාරු කිරීමට අවශ්‍ය පියවර ගැනීම. |
| (ii) දිවයින පුරා විසිරී ඇති ලංවිමෙහි ඉඩම් මැනීම, තක්සේරු කිරීම සහ ආරක්ෂා කිරීම ප්‍රමාද වීම. | 2019-10-28 දින වන විට ලංවිම ඉඩම් මැනීමේ හා තක්සේරු කිරීමේ වර්තමාන ප්‍රගතිය පහත පරිදි වේ. | ලංවිම ඉඩම් මැනීමේ හා තක්සේරු කිරීමේ ක්‍රියාවලිය වේගවත් කිරිම. |

ප්‍රධාන ඉඩම්වල සාරාංශය (ඉඩම් ප්‍රමාණය පර්චස 5 ට වඩා වැඩි)

| අනු අංකය | අංශය | මුළු තක්සේරු මුදල (රු.) | හඳුනාගත් ඉඩම් ගණන | තක්සේරු වටිනාකම | සම්පූර්ණ කිරීම (%) |
|---|---|---|---|---|---|
| 1 | බෙදා හැරීමේ අංශය 01 | 142 | 202 | 4,701,083,600 | 18 |
| 2 | බෙදා හැරීමේ අංශය 02 | 275 | 362 | 2,172,974,000 | 8 |
| 3 | බෙදා හැරීමේ අංශය 03 | 107 | 123 | 3,325,787,400 | 13 |
| 4 | බෙදා හැරීමේ අංශය 04 | 127 | 148 | 3,289,450,000 | 13 |
| 5 | වත්කම් කළමනාකරනය | 4 | 5 | 5,718,828,500 | 22 |
| 6 | සම්ප්‍රේෂණ අංශය | 61 | 118 | 6,885,541,300 | 26 |
| 7 | ජනන අංශය * | 1 | 1281 | 126,700,000 | 0 |
| | **එකතුව** | **717** | **2,239** | **26,220,364,800** | |

- මායිම් නැවත ලකුණු කිරීම සහ නැවත මායිම් නියම කිරීම යන කාර්යන් සම්පූර්ණ කිරීම
  කාසල්රී ජලාශයේ භූමිය (980A 2R 13.5P), ලක්ෂපාන විදුලි බලාගාරය සහ ගොඩනැගිලි පිහිටි භූමිය (202A 2R 39.3P), ආඩියාකන්ද ලංවිම භූමිය (3.6973 හෙක්ටයාර්) සහ කොලොන්නාව ලංවිම භූමිය.
- මායිම් නැවත ලකුණු කිරීම සහ නැවත මායිම් නියම

| | | |
|---|---|---|
| | කිරීම යන කාර්යන් කැලණිතිස්ස ලංවිම භූමිය හා මාවුස්සාකැලේ ජලාශය භූමිය තුළ සිදුවෙමින් පවතී<br>• ඔප්පු සහ පැවරීම ගැනීමේ සහතික වැනි හිමිකාරි ලේඛන 1476 ක් ලබාගෙන ඇත.<br>• ඉහළ කොත්මලේ ජල විදුලි ව්‍යාපෘතිය සහ ලක්විජය විදුලි බලාගාරය සඳහා ඉඩම් අත්පත් කර ගැනීමේ නියාමනය ක්‍රියාවලිය. | |
| (iii) වාහන දත්ත සමුදාය යාවත්කාලීන නඩත්තු කිරීම. | වත්කම් කළමනාකරණ අංශය ලංවිමෙහි වාහන දත්ත ගබඩාව පවත්වාගෙන යන අතර ලංවිම ශාඛා වලින් ලැබෙන තොරතුරු අනුව එය යාවත්කාලීනකෙරේ. 2019-10-03 වන විට යාවත්කාලීන කරන ලද සාරාංශය අමුණා ඇත (ඇමුණුම 06) | වත්කම් කළමනාකරණයේ දත්ත සමුදාය නියමිත වේලාවට යාවත්කාලීන කළ යුතුය. |
| (ආ) **බඩු තොග පාලන** | | |
| (i) තොග වාර්තා නිසි ලෙස නඩත්තු කිරීම. | සාමාන්‍යයෙන් පිළිගත් ගිණුම්කරණ මූලධර්ම (GAAP) අනුගමනය කරයි. ජනන අංශයේ තොග තක්සේරු කිරීම සඳහා, වත්කම් කළමනාකරණය සහ සම්ප්‍රේෂණ අංශයේ FIFO භාවිතා කරන අතර බෙදාහැරීමේ අංශය සම්මත මිලකරණ ක්‍රමයක් අනුගමනය කරයි. MITFIN පද්ධතියේ ඉන්වෙන්ටරි මොඩියුලය හරහා සියලුම තොග සම්බන්ධ ගනුදෙනු වාර්තා පවත්වාගෙන යනු ලැබේ. | තොග ලැබීම් සහ නිකුත් කිරීම් නිසි ලෙස සටහන් කළ යුතුය. |
| (ii) තොග හිඟය සහ අතිරික්තයන් වළක්වා ගැනීම සඳහා ගල් අඟුරු තොග හැසිරවීම සම්බන්ධයෙන් සුදුසු පාලනයක් ස්ථාපිත කිරීම හා පවත්වාගෙන යාම | විෂය කරුණු සම්බන්ධයෙන්, වාහක "0" හි ඉලෙක්ට්‍රොනික බර පරිමාණය පහත පරිදි නවීකරණය කර ඇත:<br>1. සියලුම නරක් වූ / හානියට පත් යාන්ත්‍රික කොටස් ප්‍රතිස්ථාපනය විය.<br>2. අවශ්‍ය විදුලි / අයි සහ සී කොටස් ප්‍රතිස්ථාපනය වීම.<br>3. I & C කොටස සමඟ ගතික ක්‍රමාංකනය සිදු වෙමින් පවතී.<br>4. උපකරණ සහ පාලන අංශය ක්‍රියාත්මක වෙමින් පවතී. | ගල් අඟුරු තොගය ලැබීම් මැනිය යුතු අතර වසර අවසානයේදී තොග ගණනය සිදු කළ යුතුය. |
| (ඇ)**ව්‍යාපෘති කළමනාකරණය සහ පාලනය** | | |
| කාල රාමුව තුළ ව්‍යාපෘතිය නිම කිරීම. | සියලුම ව්‍යාපෘති ක්‍රියාකාරකම් සහ වාර්තාකරණ අවශ්‍යතා AGM ව්‍යාපෘති අංශය විසින් අධීක්ෂණය කරනු ලැබේ. | ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සැලසුම් කළ පරිදි කළ යුතුය. |

| | | |
|---|---|---|
| (ඈ)ගිණුම්කරණ පද්ධතිය<br>ගිණුම්කරණ පද්ධතියේ පවතින අභ්‍යන්තර පාලනයන්හි ඇති දුර්වලතා හේතුවෙන් 2013 වර්ෂයේ සිට ලංවිමෙහි මූල්‍ය ප්‍රකාශන අඛණ්ඩව නැවත සකස් කිරීම. | මූල්‍ය ප්‍රකාශන නැවත සකස් කිරීම වළක්වා ගැනීම සඳහා අභ්‍යන්තර පාලන පද්ධතිය ශක්තිමත් කිරීමට පියවර ගනු ඇත. | මූල්‍ය ප්‍රකාශන නැවත සකස් කිරීම වළක්වා ගැනීම සඳහා අභ්‍යන්තර පාලන පද්ධතිය ශක්තිමත් කිරීමට පියවර ගත යුතුය. |
| **(ඉ) මෙහෙයුම් අත්පොත** | | |
| මණ්ඩලයේ කටයුතු පහසු කිරීම සඳහා නියමිත වේලාවට අත්පොත් යාවත්කාලීන කර නොමැත. | ලංවිම අවශ්‍යතාවයට අනුකූල වේ. | මණ්ඩලයේ කටයුතු පහසු කිරීම සඳහා නියමිත වේලාවට අත්පොත යාවත්කාලීන කිරීම. |

## 1.8 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම

### 1.8.1 ලැබිය යුතු මුදල්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ)2018 දෙසැම්බර් 31 දිනට රු.19,038,547,212 ක් වූ වෙළඳ ණයගැති ශේෂයෙන්, සාමාන්‍ය හා තොග සැපයුම්වලට අදාළව රු.3,754,841,442 ක ශේෂයක් වර්ෂයකට වැඩි කාලයක් හිඟ හිට පැවති අතර, ඉන් රු.1,827,399,804 ක් වර්ෂ 5 කට වැඩි කාලයක් අයකර ගැනීමෙන් තොරව පැවතුණි. තවද, රු.423,764,624 ක් 2012 වර්ෂයේ සිට හඳුනාගත නොහැකිව පැවතුණි. | දිගු කාලීන ණය ගැතියන්ගේ ශේෂයන් අය කර ගැනීමට ලංවිම ප්‍රමාණවත් පියවර ගෙන තිබේ.<br>•රු.මිලියන 841 ක ණය ගැති ශේෂවලට නීතිමය පියවර ගන්නා ලදි.<br>•රු. මිලියන 385 ක ආරවුල් ශේෂයන් විසඳීම සඳහා කමිටුව පත් කරන ලදි.<br>•රු.මිලියන 125ක ණය ගැති ශේෂවලට එරෙහිව ලියාහරින ලදි.<br>•හිඟ ගිණුම් සියල්ලම අවසන් කර ඇති අතර මතක් කිරීමේ ලිපි යැවීම, බේරුම්කරණයට යොමු කිරීම වැනි | මුළු ණය ගැතියන්ගේ ශේෂයෙන් සියයට 20 ක් පමණ වසරකට වඩා වැඩි ය. එබැවින් අවසන් කරන ලද ගනුදෙනුකරුවන්ගෙන් නැවත අයකර ගැනීමට ක්ෂණික පියවර ගත |

| | | | | |
|---|---|---|---|---|
| | | | අඛණ්ඩ අයකර ගැනීමේ ක්‍රියාමාර්ග ගන්නා ලදි. | යුතුය. |
| (ආ)සීමාසහිත ලංකා විදුලි (පෞද්ගලික)සමාගමෙන් (LECO) ලැබිය යුතු රු.32,765,469 ක මුදලක් අයකර ගැනීමට කටයුතු කිරීමෙන් තොරව වර්ෂ 5 කට වැඩි කාලයක් හිඟ හිට පැවතුණි. | | | මණ්ඩල අනුමැතිය ලබා ගැනීමෙන් පසු රු.32,765,469 ක් ගිණුම් පොත්වලින් කපා දමා ඇත. | ඕනෑම ආරවුලක් දීර්ඝ කාලයක් නොගෙන විසඳිය යුතුය. |
| (ඇ)2018 දෙසැම්බර් 31 දින වන විට රු.2,505,752,812 ක් වූ පහත සඳහන් ලැබිය යුතු වෙනත් ශේෂයන් වසර පහකට වැඩි කාලයක් අයකරගෙන නොතිබුණි. | | | | |
| **ණය ගැතියාගේ නම** | **මුදල (රු.)** | **විස්තරය** | | |
| මහා භාණ්ඩාගාරය | 225,000,000 | වීදි ආලෝක කරණයේ සහ නඩත්තු කිරීමේ පිරිවැය අයකර ගැනීම. | **වීදි ආලෝකකරණයේ සහ නඩත්තු කිරීමේ පිරිවැය අයකර ගැනීම.** ඉතිරි මුදල භාණ්ඩාගාරයෙන් ලැබිය යුතු (වීදි ආලෝකකරණය සහ ට්‍රාන්ස්ෆෝමර් කුලියට ගැනීම වැනි) වන අතර මහා භාණ්ඩාගාරය විසින් දෙන ලද උපදෙස් අනුව ව්‍යාපෘති ණය සඳහා පොළිය සහ ණය ආපසු ගෙවීමට එරෙහිව හිලව් කිරීමට අපේක්ෂා කෙරේ. | ගනුදෙනුව සිදුවන අවස්ථාවේ දී ඕනෑම කාර්යයන් සඳහා වන වියදම් අය කර ගැනීමට අභ්‍යන්තර පාලනය ශක්තිමත් කළ යුතුය. |
| වුඩ් ගෲප් ගෑස් ටර්බයින් ලිමිටඩ්. | 8,264,352 | බටහිර වෙරළ බලාගාරයට පිවිසුම් මාර්ගයක් ඉදිකිරීම සඳහා ගෙවීම. | **බටහිර වෙරළ බලාගාරයට පිවිසුම් මාර්ගයක් ඉදිකිරීම සඳහා ගෙවීම.** දැනට එවැනි සමාගමක් රට තුළ නොමැති හෙයින් සහ ඉහත සඳහන් කළ නීති නිලධාරියාගේ පිළිතුරත් සමඟ ඉතිරි මුදල කපා හැරීමට තීරණයක් ගෙන ඇති අතර අනාගතයේදී එය සිදු කරනු ඇත. වුඩ් ගෲප් ගෑස් ටර්බයිනය කොළඹ වරායේ සිට පන්නිපිටිය අඩවියට ප්‍රවාහනය කිරීම සඳහා ඔවුන්ගේ ට්‍රේලරය භාවිතා කිරීම සඳහා මෙම ගෙවීම ඉතාලියේ ෆැගෝලි (Fagioli) වෙත සිදු කර ඇත. මෙම ගෙවීම බටහිර වෙරළ බලාගාරයට සම්බන්ධ නොවේ. නි.සා(බලශක්ති මිලදී ගැනිම) සම්ප්‍රේෂණය සමඟ හුවමාරු කල ලිපි ලබා ගත හැකිය. | |

| | | | |
|---|---|---|---|
| විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශය | 6,142,277 | කෙරවලපිටිය ඒකාබද්ධ විදුලි බලාගාරයේ සමාරම්භක උත්සවය සඳහා ගෙවීම. | **කෙරවලපිටිය ඒකාබද්ධ විදුලි බලාගාරයේ සමාරම්භක උත්සවය සඳහා ගෙවීම.**<br>මෙම මුදල පියවා ගැනීම සඳහා 2018 ජූලි 18 දිනැති CEB / CH / BS / Aud.Gen / 17 යන ලිපිය මගින් ලංවිම සභාපති වෙස්ට් කෝස්ට් පවර් (පුද්ගලික) සමාගමෙන් ඉල්ලා ඇත. එහෙත් මේ සම්බන්ධයෙන් කිසිදු ප්‍රතිචාරයක් නොලැබුණි. |
| ශ්‍රී ලංකාවේ සුනිත්‍ය බලශක්ති අධිකාරිය | 897,025,999 | කුඩා ජලවිදුලි සංවර්ධකයින්ට ලංවිම විසින් ගෙවන ලද ගැලපුම් ගාස්තු. | **කුඩා ජලවිදුලි සංවර්ධකයින්ට ලංවිම විසින් ගෙවන ලද ගැලපුම් ගාස්තු.**<br>විදුලිබල, බලශක්ති හා ව්‍යාපාර සංවර්ධන අමාත්‍යාංශය ලේකම් විසින් 2019-10-10 දින පත් කරන ලද කමිටුවේ තීරණය ලැබීමෙන් පසු ඉදිරි පියවර ගනු ලැබේ (ඇමුණුම 04) |
| ඒ‍ර්එස් කැලණිතිස්ස (පුද්ගලික) සමාගම | 1,368,961,445 | මිල වෙනස්කම් ගෙවීමෙන් අය කර ගත යුතු මුදල. | **මිල වෙනස්කම් ගෙවීමෙන් අය කර ගත යුතු මුදල.**<br>ලංකා විදුලිබල මණ්ඩලයේ සභාපතිවරයා අමතා විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් 2012 මාර්තු 19 දිනැති ලිපිය මගින් දැනුම් දී ඇත්තේ දැනටමත් සපයා ඇති සහ අනාගතයේදී විදුලිබල උත්පාදනය සඳහා ලංවිම/ අයි පී පී වෙත සැපයීමට නියමිත, ඔටෝ ඩීසල් සඳහා 2011 ජූලි මස සිට බලපැවැත්වෙන ඔටෝ ඩීසල් වලට අදාල සිල්ලර මිල ගණන් අදාල කර ගත යුතු බවයි. ඒ අනුව ඛනිජ තෙල් සංස්ථාව විසින් ඉන්වොයිසි නැවත සකස් කිරීමට කටයුතු කරනු ඇත. ලංවිම ඒ ර් එස් කැලණිතිස්ස (පුද්ගලික) සමාගම සමඟ ගිවිසුමක් ඇති කර ගත් අතර ඉන්ධන මිල විදුලිබල නිෂ්පාදකයින්ගේ පිරිවැය හරහා ගමන් කරන බැවින්, ඛණිජ තෙල් නීතිගත සංස්ථාව එම වාසිය විදුලිබල නිෂ්පාදකයින්ට ලබාදුන් පසු එය ආපසු අය කර ගත හැකිය.<br><br>කෙසේ වෙතත් ඛණිජ තෙල් නීතිගත සංස්ථාව ලීටරය රු. 76 බැගින් 2011 ඔක්තෝම්බර් සිට ඉන්වොයිසි කලද පෙර ඉන්වොයිසි සඳහා නැවත ගැලපීම් |

| | | | |
|---|---|---|---|
| | | | නොකරන ලදි. එම හේතුවෙන් එය ඛණිජ තෙල් නීතිගත සංස්ථාවෙන් ලැබිය යුතු ලෙස වාර්තා කර ඇත. එය 2015 පෙබරවාරි මස නිවැරදි කල අතර ඒ.ඊ.එස් කැළණිතිස්ස සමාගමෙන් ලැබිය යුතු ශේෂ ලෙස වාර්තා කරන ලදි. නමුත් ඛණිජ තෙල් නීතිගත සංස්ථාව විසින් එම මිල වෙනස ගැලපීමෙන් පසු ඒ.ඊ.එස් කැළණිතිස්ස සමාගමෙන් ලංවිමට එය අයකල හැක. |
| නෝර්ත් පවර් (පුද්ගලික) සමාගම | 358,739 | 2011 දී සම්පූර්ණ කරන ලද වර්ධන කිරීමේ කාර්යයන් අය කර ගත යුතු මුදල. | **2011 දී සම්පූර්ණ කරන ලද වර්ධන කිරීමේ කාර්යයන් අය කර ගත යුතු මුදල.** මෙය ලැබිය යුතු ශේෂයක් වන අතර එය 2011 දී ලංවිම විසින් සම්පූර්ණ කරන ලද වර්ධන කාර්යයක් හා සම්බන්ධ වේ. |
| **මුළු එකතුව** | **2,505,752,812** | | |

| | | |
|---|---|---|
| (ඇ) ලංකා කෝල් සමාගමෙන් ලැබිය යුතු රු.714,965,435 ක මුදලක් කිසිඳු අයකිරීම් ක්‍රියාමාර්ගයක් ගැනීමෙන් තොරව වර්ෂ 5 කට වැඩි කාලයක් හිඟ හිට පැවතුණි. | M/s ලිබර්ටි කොමොඩිටීස් ලිමිටඩ් සහ M/s ටෝරියන් යකඩ සහ වානේ සමාගමට එරෙහිව ලංකා ගල් අඟුරු සමාගම විසින් ගනු ලැබූ නීතිමය ක්‍රියාමාර්ගවලින් පසුව මෙම ශේෂය ඉවත් කරනු ලැබේ. තවමත්, තීරණය විභාග වෙමින් පවතී. | පිරිවැය අය කර ගැනීමට සහ ආවස්ථික පිරිවැය වළක්වා ගැනීමට වහාම නීතිමය පියවර ගත යුතුය. |
| (ඉ) වත්කම් කළමනාකරණ අංශයේ වෙනත් ලැබිය යුතු ශේෂ යටතේ දැක්වෙන රු.153,734,062 ක මුදලක් වර්ෂ 5 කට වැඩි කාලයක් අයකර ගැනීමෙන් තොරව පැවතුණි. එම මුදලින් රු.146,090,787 ක මුදලක් රජයේ ආයතන වලින් අයකර ගත යුතු අතර ලංකා විදුලි බල මණ්ඩලය විසින් ගනුදෙනුවල ආරම්භක අවධියේදී එම මුදල් අයකර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | වත්කම් කළමනාකරණ අංශයේ ප්‍රා.ඉ(විදුල ජනන යන්ත්‍ර), ප්‍රා.ඉ (වායුසමීකරණ හා ශීතකරණ) සහ ප්‍රා.ඉ (සෝපාන) විසින් සිදු කරන ලද රජයේ ආයතනවලට අයත් විදුලි ජනක යන්ත්‍ර, වායු සමීකරණ සහ සෝපානවල වාර්ෂික නඩත්තු කටයුතු සඳහා රජයේ ආයතනවලින් ගෙවිය යුතු හිඟ මුදල නියෝජනය කරයි.<br>වාර්ෂික නඩත්තු කටයුතුවලදී, විගණන වාර්තාවේ සඳහන් පරිදි මූලික අදියරේදී නොව නඩත්තු කටයුතු අවසන් වූ පසු ගනුදෙනු වටිනාකම අයකර ගනු ලැබේ.නි.සා.(වැඩපල හා උපකාරක සේවා) රජය සමඟ දැනට පවත්නා නඩත්තු ගිවිසුම් අත්හිටුවීම වැනි මතක් කිරීම් යැවීම වැනි විශාල උත්සාහයන් ගෙන තිබෙන අතර කල් ඉකුත් වූ | ගනුදෙනුව සිදු වූ අවස්ථාවේ ලැබිය යුතු වටිනාකම අය කර ගැනීමට පියවර ගත යුතුය. |

| | | |
|---|---|---|
| | ශේෂයන් අයකර ගැනීමට සහ එහි ප්‍රතිඵලයක් ලෙස රජයේ ලැබිය යුතු මුදල් 2018 අවසන් වන විට රු. මිලියන 146 ක් වන අතර මෙය තවදුරටත් 2019 අප්‍රේල් වන විට රු. මිලියන 139 කි.<br><br>කල් ඉකුත් වූ ලැබිය යුතු මුදල් පිළිබඳව පද්ධති විගණනයක් සිදු කරන ලෙස අ.ති.සා. (වත්කම් කළමනාකරණය) විසින් ප්‍රධාන අභ්‍යන්තර විගණකගෙන් ඉල්ලා ඇත. විගණන වාර්තාව ලැබුණු වහාම මේ සම්බන්ධයෙන් වැඩිදුර ක්‍රියාමාර්ග ගනු ලැබේ. | |

**1.8.2 ගෙවිය යුතු මුදල්**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ)චයිනා මැෂිනරි ඉන්ජිනියරින් කෝපරේෂන් සමාගමට ගෙවිය යුතු රු.4,834,319,648 ක මුදලක් නිරවුල් කිරීමෙන් තොරව වර්ෂ 1 කට වැඩි කාලයක් පැවතුණි. | 2014 සහ 2015 වර්ෂය සඳහා හිඟ ගෙවීම් පියවා ඇත. 2016, 2017 සහ 2018 සඳහා ගෙවීම් අපේක්ෂිතය. වර්තමාන මූල්‍ය තත්ත්වය සැලකිල්ලට ගනිමින් ලංවිම මසකට ඇමරිකානු ඩොලර් මිලියන 2 ක් පමණක් නිදහස් කරයි. | සේවා සපයන්නා සමඟ ඇති වන ආරවුලක් වළක්වා ගැනීම සඳහා වගකීම් පියවීමට පියවර ගත යුතුය. |
| (ආ) වර්ෂයකට වැඩි කාලයක් නිරවුල් කිරීමට කටයුතු කිරීමෙන් තොරව රු.2,713,788,005 ක මුදලක් වෙළඳ ණය හිමියන් ලෙස දක්වා තිබුණි. | එම හිඟ මුදල් පියවා ගැනීමේ හැකියාව සහතික කිරීමට පියවර ගෙන තිබේ. | සැපයුම්කරුවන් සමඟ ඇති වන ආරවුල් වළක්වා ගැනීම සඳහා වගකීම් පියවීමට පියවර ගත යුතුය. |

**1.9 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම**

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) 2009 අංක 20 දරන ශ්‍රී ලංකා විදුලිබල පනතේ 28 (3) වගන්තිය | ලංවිම විසින් එහි පාරිභෝගික තැන්පතුවලට පනතේ දක්වා ඇති පරිදි පොලියක් ගෙවා නොතිබූ අතර, 2018 වර්ෂය සඳහා ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් | ශ්‍රී ලංකා විදුලිබල පනතේ අංක 3 (ඇ) සහ අංක 30 වගන්තියට අනුව විදුලි ගාස්තු PUCSL විසින් එවනු ලැබේ. කෙසේ වෙතත් පවත්නා විදුලි ගාස්තු මඟින් ලංවිම ව්‍යාපාර කටයුතු කරගෙන යාමට ප්‍රමාණවත් මුදල් උත්පාදනය | මණ්ඩලය පනතේ අවශ්‍යතාවයන්ට අනුකූල විය යුතුය. |

සභාව විසින් වාර්තා කරන ලද රේටය පදනම් කරගෙන විගණනය විසින් කරන ලද ගණනය කිරීම අනුව, ඒ සඳහා ගෙවිය යුතු පොලිය රු. මිලියන 1,562 ක් වූ අතර, 2018 දෙසැම්බර් 31 දිනට නොගෙවූ සමුච්චිත පොලිය රු. මිලියන 3,526 ක් විය.

නොවේ.

පනතේ අදාළ වගන්තිය පහත පරිදි වේ;

3 (1) කොමිෂන් සභාවේ කාර්යය වනුයේ ශ්‍රී ලංකාවේ විදුලි කර්මාන්තය සඳහා ආර්ථික, තාක්ෂණික හා ආරක්ෂණ නියාමක ලෙස ක්‍රියා කිරීම සහ -

(ඇ) බලපත්‍රලාභීන් සහ වෙනත් විදුලිබල ආයතන විසින් අය කරනු ලබන ගාස්තු සහ වෙනත් ගාස්තු නියාමනය කිරීම පාරිභෝගිකයින්ට හැකි උපරිම ආර්ථික හා කාර්යක්ෂම සේවාවක් සැපයීම සහතික කිරීම සඳහා;

30 (1) මෙම කොටස අදාළ වේ - සම්ප්‍රේෂණය සහ තොග වශයෙන් විදුලිය විකිණීම සඳහා සම්ප්‍රේෂණ බලපත්‍රලාභියා විසින් අය කරනු ලබන ගාස්තු හෝ ගාස්තු (මෙතැන් සිට "සම්ප්‍රේෂණ සහ තොග විකුණුම් ගාස්තු" ලෙස හැඳින්වේ); සහ විදුලිය බෙදා හැරීම සහ සැපයීම සඳහා බෙදාහැරීමේ බලපත්‍රලාභියා විසින් අය කරනු ලබන ගාස්තු හෝ ගාස්තු (මෙතැන් සිට "බෙදාහැරීමේ සහ සැපයුම් ගාස්තු" ලෙස හැඳින්වේ)

(2) සම්ප්‍රේෂණ සහ තොග විකුණුම් සහ ගාස්තු බෙදා හැරීමේ සහ සැපයුම් ගාස්තු අදාළ බලපත්‍රයේ නිශ්චිතව දක්වා ඇති කොන්දේසිවලට අනුකූල විය යුතුය.

කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද පිරිවැය පරාවර්තක ක්‍රමවේදයකට අනුකූලව අදාළ බලපත්‍රලාභියා විසින් නියම කරනු ලැබේ;

කාර්යක්ෂම පදනමක් මත සිය බලපත්‍රය මගින් බලය පවරන ලද ක්‍රියාකාරකම් සිදු කිරීමේදී දැරීමට සිදුවන සියලු සාධාරණ වියදම් අය කර ගැනීමට අදාළ බලපත්‍රලාභියාට අවසර දේ,

5 වන වගන්තිය යටතේ අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලද ප්‍රතිපත්ති මාර්ගෝපදේශයට අනුකූලව කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලැබේ; සහ
මහජන දැනුම සහතික කිරීම පිනිස කොමිෂන් සභාව විසින් ඉල්ලා සිටින ආකාරයකින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

සෑම බෙදාහැරීමේ බලපත්‍රයක්ම (ඩීඑල්) සිය ගනුදෙනුකරුවන්ට සුරැකුම්පත් තැන්පතු සඳහා පොළිය ගෙවිය යුතුය. පනතේ අදාළ වගන්තිය පහත පරිදි වේ;
28 වන වගන්තිය (3) “මෙම කොටස අනුව ආරක්ෂණ ක්‍රමයක් මගින් බෙදාහැරීමේ බලපත්‍රලාභියෙකුට කිසියම් මුදලක් ලබා දෙන්නේ නම්. වරින් වර කොමිෂන් සභාවේ අනුමැතිය ඇතිව බලපත්‍රලාභියා විසින් නියම කරනු ලබන අනුපාතයට එය බලපත්‍රලාභියාගේ අතේ පවතින කාල සීමාව සඳහා බලපත්‍රලාභියා එවැනි මුදලක් මත පොලිය ගෙවිය යුතුය.

වර්තමානයේදී ලංවිම සිය ව්‍යාපාරය පවත්වාගෙන යාමට ප්‍රමාණවත් මුදල් එකතු කිරීමක් නොකරන අතර එහි ප්‍රතිඵලයක් ලෙස ලංවිම සිය ගනුදෙනුකරුවන්ගේ ආරක්ෂක තැන්පතු සිය කාරක ප්‍රාග්ධනයේ කොටසක් ලෙස භාවිතා කරන අතර බැංකු අයිරා, කෙටිකාලීන ණය ආදියෙන් ශේෂ කාරක ප්‍රාග්ධනය ලබා ගනී.

සිය ගනුදෙනුකරුවන්ගේ ආරක්ෂක තැන්පතු එහි කාරක ප්‍රාග්ධනය ලෙස ලංවිම විසින් භාවිතා කිරීමෙන් ලබා ගන්නා ප්‍රතිලාභ උදාහරණයක් ලෙස එනම් බැංකු අයිරා සඳහා පොළිය, ඉතිරි කිරීම. තීරුබදු අඩු කිරීම මගින් සියළුම පාරිභෝගිකයින් අතර බෙදා හරිනු ලැබේ.

| | | | |
|---|---|---|---|
| | | තවද, 2018 වර්ෂය සඳහා ලං.වි.ම සිය ගනුදෙනුකරුවන් අතර රුපියල් මිලියන 1,562 කට වඩා බෙදා හැර ඇති අතර, එය කෙටුම්පත් විගණන වාර්තාවේ දක්වා ඇති ඇස්තමේන්තුගත වටිනාකම වන අතර එය ආරක්ෂක තැන්පතු බැංකුවක තැන්පත් කර තිබේ නම් එය උපයා ගත හැකි පොළිය වේ.<br><br>මෙම වගන්තියට අනුව ඩීඑල් ආරක්ෂක තැන්පතු සඳහා පොළිය ගෙවීමට යන්නේ නම් එය ඩීඑල් සඳහා අමතර මූල්‍ය බරක් වන අතර කර්මාන්තයට අමතර පිරිවැයක් වනු ඇත.<br><br>එබැවින් 2009 අංක 20 දරණ ශ්‍රී ලංකා විදුලිබල පනතේ අංක 28 (3) වගන්තිය සම්පූර්ණයෙන් ඉවත් කිරීමට අපි නිර්දේශ කර ඇති අතර මේ සම්බන්ධයෙන් ඉදිරි ක්‍රියාමාර්ග ගන්නා ලෙස අමාත්‍යාංශයෙන් ඉල්ලා සිටිමු. | |
| (ආ) 1969 අංක 17 දරන ලංකා විදුලිබල මණ්ඩල පනත<br>i. 47 (2) (අ) වගන්තිය | ලංකා විදුලිබල මණ්ඩලයේ චංචල හා නිශ්චල දේපලවල ක්ෂය ආවරණය කිරීමේ අරමුණින් ලං වි ම විසින් මහා භාණ්ඩාගාරය සමඟ ක්ෂය සංචිතයක් ස්ථාපිත කර පවත්වාගත යුතුය. කෙසේ වුවද, මෙම අවශ්‍යතාවයට පටහැනිව, 2000 දෙසැම්බර් 31 දක්වා වාර්ෂිකව රු මිලියන 1 ක් මාරු කිරීම මඟින් ලං වි ම විසින් එහි මූල්‍ය ප්‍රකාශනවල ක්ෂය සංචිතයන් ඇති කර තිබූ අතර, ඉන් පසු කිසිදු මෙහෙයවීමක් සිදු කර නොතිබුණි. එදිනට සමුච්චිතව පැවති රු.23 ක මුදලක් කිසිදු සමාලෝචනයකින් තොරව මූල්‍ය ප්‍රකාශනවල | 47 (2) (අ) වගන්තිය යටතේ මණ්ඩලය විසින් ලංවිමෙහි චංචල හා නිශ්චල දේපල ක්ෂය කිරීම ආවරණය කිරීම සඳහා මූල්‍ය ප්‍රකාශනවල ක්ෂය කිරීමේ සංචිතයක් ස්ථාපිත කරන ලදි. ලංවිම අඛණ්ඩව පාඩු ලබන බැවින් මෙම ගිණුම වසර ගණනාවක් තිස්සේ යාවත්කාලීන කර නොමැත. කෙසේ වෙතත්, ලංවිම ලාභ ලැබූ පසු ඔබගේ අදහස් අනුව , ක්ෂයවීම් සංචිත ගිණුම යාවත්කාලීන කිරීම සඳහා රු. මිලියනයක් වාර්ෂිකව ක්ෂයවීම් සංචිත ගිණුමට මාරු කරනු ලැබේ. | වත්කම් පදනම සැලකිල්ලට ගනිමින්, වත්කම් ආදේශ කිරීම සඳහා සංචිතය පවත්වා ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| | අඛණ්ඩව ඉදිරියට ගෙනැවිත් තිබුණි. | | |
| ii. 1971 අංක 38 දරන මුදල් පනතේ II වන කොටසේ 46 වන වගන්තිය සහ 11 (අ) සහ (ආ) වගන්තිය | ලංකා විදුලිබල මණ්ඩලය විසින් 1989 වර්ෂයේ සිට එක් එක් වර්ෂය අවසානයේදී දළ ස්ථාවර වත්කම් මුළු වටිනාකමින් සියයට 0.1 ක දායකයක් ඉන්ෂුවරන්ස් එස්ක්‍රෝ අරමුදලට මාරු කළ යුතු බව දක්වා තිබුණද, 2018 දෙසැම්බර් 31 දිනට රු. මිලියන 8,070 ක් පමණක් එම අරමුදලේ ආයෝජනය කර තිබුණි. | න්‍යායාත්මකව රක්ෂණ අරමුදල් සංචිත ගිණුම් ශේෂය සහ එස්ක්‍රෝ ගිණුම් ශේෂය සඳහා වන ආයෝජනය යම් දිනයක දී සසඳන බව පිළිගනු ලැබේ. 2018-12-31 වන විට පොත්වලට අනුව රක්ෂණ සංචිත ශේෂය රු.මිලියන 16,304 ක් වූ අතර රක්ෂණ ආයෝජන ගිණුම රු.මිලියන 8,070 කි. මෙම වෙනස ඇතිවීමට ප්‍රධාන වශයෙන් ලංවිම වසර ගණනාවක් තිස්සේ අයහපත් මුදල් ප්‍රවාහ තත්වයක් අත්විදීම නිසා රක්ෂණ ආයෝජන එස්ක්‍රෝ ගිණුමේ ආයෝජනය නොකිරීමය. (2018) වර්ෂයේ දී පවා ලංවිම රු. 30,458 ක පාඩු ලැබීය. මෙහි ප්‍රතිඵලයක් ලෙස ලංවිම සාමාන්‍යයෙන් රු.බි.6 - රු.බි.7 අයිරා ධාවනය වන අතර බැංකු ණය රු. බි.80 කි. එබැවින් අයිරා / ණය පහසුකම් ලබා ගැනීම නිසා එස්ක්‍රෝ ගිණුමේ ආයෝජනය කිරීම නුසුදුසුය. කෙසේ වෙතත්, ලංවිම ද්‍රවශීලතා තත්ත්වය සහ මුදල් ප්‍රවාහය වර්ධනය වූ පසු රක්ෂණ සංචිත ආයෝජන ගිණුමේ දළ ස්ථාවර වත්කම්වලින් 1% ට සමාන ආයෝජනයක් කිරීමට පියවර ගනු ලැබේ. | වත්කම් පදනම සැලකිල්ලට ගනිමින්, වත්කම් සඳහා සංචිතය පවත්වා ගත යුතුය. |

**1.10** බදු රෙගුලාසිවලට අනුකූල නොවීම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2007 සැප්තැම්බර් 13 දින වැටුප් සංශෝධනයේදී හා 2015 මැයි 20 දින සාමූහික ගිවිසුම සැලකිල්ලට ගැනීමේදී උපයන විට ගෙවීම් බදු බැරකම (PAYE) සේවකයන් වෙත මාරු කිරීම සඳහා අමාත්‍ය මණ්ඩලය විසින් තීරණයන් ගෙන තිබුණි. කෙසේ වුවද , අමාත්‍ය | ලංවිම සේවකයින් ගෙවීම් (PAYE) බද්ද සඳහා වගකිව යුතු බැවින් එහි සේවකයින්ගේ ගෙවීම් (PAYE) බදු වගකීම ලංවිම විසින් දරනු ලැබේ. මෙය විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති හා වැටුප් හා සේවක කොමිෂන් සභාවට කිහිප වතාවක්ම දැනුම් දුන් අතර වෘත්තීය සමිති සමඟ ද සාකච්ඡා පැවැත්විණි. කෙසේ වෙතත්, එය නැවත සේවකයින් වෙත ආපසු ලබා දීම සම්බන්ධයෙන් එකඟතාවකට පැමිණියේ නැත. 2018-01-04 දින අත්සන් කරන ලද සාමූහික ගිවිසුම 2018-04-23 දිනැති අතිරේක සාමාන්‍ය ගැසට් අංක 2068/5 මගින් ප්‍රකාශයට පත් | සේවකයින්ගෙන් ගෙවීම් බද්ද අය කර ගැනීමට පියවර ගත යුතුය. |

මණ්ඩලය විසින් ගන්නා ලද ඉහත තීරණයන්ට පටහැනිව, 2010 සිට 2018 දක්වා කාල පරිච්ඡේදය තුළ අදාල සේවකයන්ගේ වැටුප් වලින් අඩුකිරීමෙන් තොරව ලංකා විදුලි බල මණ්ඩලය විසින් එහි අරමුදල් වලින් රු.4,210,046,371 ක් වූ උපයන විට ගෙවීම් බදු ගෙවා තිබුණි. සමාලෝචිත වර්ෂය තුළ එසේ ගෙවන ලද මුදල රු.915,698,241 ක් වූ අතර, පෙර වර්ෂයට සාපේක්ෂව එය සියයට 35 ක වැඩිවීමක් විය.

තවද, 2001 මැයි 20 දිනැති අංක 1706/18 දරන ගැසට් නිවේදනයේ දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් විසින් දක්වා ඇති මුදල් නොවන ප්‍රතිලාභ වටිනාකම එක් එක් සේවකයාගේ උපයනවිට ගෙවීම් බදු ගණනය කිරීමේදී සැලකිල්ලට ගත යුතුය. කෙසේ වුවද, නිල නිවාස, මහල් නිවාස සැපයීම හා පුද්ගලික භාවිතය සඳහා මෝටර් වාහන ආදිය ලබා දීම වැනි මුදල් නොවන ප්‍රතිලාභ මෙම කාර්යය සඳහා ලංකා විදුලිබල මණ්ඩලය විසින් සැලකිල්ලට ගෙන නොතිබුණි.

කර ඇත. එකඟ වූ වේතනය වෙනස් කිරීම සාමූහික ගිවිසුම උල්ලංඝනය කිරීමක් ලෙස දැන් පෙනී යන අතර එය තවදුරටත් නීතිමය ප්‍රතිවිපාක ඇති කරයි. තවද, එක් එක් සේවකයාගේ ගෙවීම් බද්ද(PAYE) ගණනය කිරීමේදී 2001 මැයි 20 දිනැති ගැසට් නිවේදන අංක 1706/18 හි දේශීය ආදායම් කොමසාරිස් ජෙනරාල් විසින් නිශ්චිතව දක්වා ඇති මුදල් නොවන ප්‍රතිලාභවල වටිනාකම සලකා බැලිය යුතුය.

PAYE ගණනය කිරීමේදී පුද්ගලික භාවිතය සඳහා නිල නිවාස, මහල් නිවාස සහ මෝටර් වාහන වැනි මුදල් නොවන ප්‍රතිලාභ ලබා ගැනීම සඳහා 2018 / GM / 39 / FM, ගිණුම් චක්‍රලේඛ අංක 526 හරහා උපදෙස් නිකුත් කර ඇත. 2018 දී නව දේශීය ආදායම් පනත ක්‍රියාත්මක කිරීමත් සමඟ උපදෙස් නිකුත් කර ඇති බැවින්, ලංවිමෙහි සියලුම අංශ විසින් මෙයට අනුකූල වීමට සාධාරණ කාලයක් ගතවනු ඇත.

## 2. මූල්‍ය සමාලෝචනය

-----------------------

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

---------------

සමාලෝචනයට භාජනය වූ වර්ෂයේ බදු ගෙවීමට පෙර අලාභය රු.මිලියන 28,865 ක් වන අතර ඊට අනුරූපව පෙර වර්ෂයේ බදු ගෙවීමට පෙර අලාභය රු. මිලියන 46,011 කි. එබැවින් රු.මිලියන 17,146 ක වර්ධනයක් නිරීක්ෂණය විය. ජල විදුලි උත්පාදනය සියයට 59 කින් වැඩි වීම නිසා ඉන්ධන පිරිවැය සහ බලශක්ති මිලදී ගැනීම් පිළිවෙලින් සියයට 28 කින් සහ සියයට 5 කින් අඩු වීම මෙම වර්ධනයට හේතු විය. තවද, උත්පාදන, සම්ප්‍රේෂණ සහ බෙදාහැරීම් අංශවල, මෙහෙයුම් හා නඩත්තු වියදම් පිළිවෙලින් සියයට 18, 44 සහ 19 කින් වැඩි වී තිබුණි, තවද, සේවක පිරිවැය, බැංකු අයිරා හා ණය සඳහා පොළිය, ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ ගෙවීම් ප්‍රමාදය සඳහා පොළී ගෙවීම් පිළිවෙලින් රු.මිලියන 8,050 කින් හෝ සියයට 27 කින්, රු.මිලියන 4,636 ක් හෝ සියයට 68 කින් සහ රු.මිලියන 1,466 ක් හෝ සියයට 68 කින් පෙර වසරට සාපේක්ෂවවැඩි වී තිබුණි.

කෙසේ වෙතත් එකතුව රු මිලියන 73,406 ක් වූ, සේවක පඩිනඩි, බදු වියදම් සහ ක්ෂයවීම් සැලකිල්ලට ගත්විට සමාලෝචනය කරන ලද වර්ෂය සඳහා ලංවිම අගය එකතු කිරීම් රු. මිලියන 57,541 ක් වූ අතර එය පසුගිය වසරට සාපේක්ෂව රු. මිලියන 29,495 ක් හෙවත් සියයට 105 කින් වැඩි වීතිබුණි.

### 2.2 අනුපාත විශ්ලේෂණය

-------------------------

#### 2.2.1 කාරක ප්‍රාග්ධන කළමනාකරණය

-------------------------------------

2018 දෙසැම්බර් 31 දින වන විට ලංවිමෙහි කාරක ප්‍රාග්ධනය රු. මිලියන 37,987 ක් සෘණ ශේෂය ලෙස පිළිබිඹු වූ අතර එය පසුගිය වසරේ දී රු. මිලියන 55,683 ක සෘණ ශේෂයක් විය. එබැවින් සමාලෝචනයට භාජනය වූ වර්ෂයේ කාරක ප්‍රාග්ධනය පෙර වසරට සාපේක්ෂව සියයට 32 කින් වැඩි වී තිබුණි.

#### 2.2.2 ස්කන්ධයට ණය

-------------------

ලංවිම අඛණ්ඩ ශුද්ධ අලාභය හේතුවෙන් 2018 දෙසැම්බර් 31 වන විට ලංවිමෙහි හිමිකම් ශේෂය පසුගිය වසරෙහි සියයට 11 කඅඩු වීමට සාපේක්ෂව 8 කින් අඩු වී තිබුණි. 2018 දෙසැම්බර් 31 දින වන විට ලංවිම විසින් යෙදවූ මුළු ප්‍රාග්ධනයෙන් සියයට 23 ක් හෙවත් රු.බිලියන 297 ක් ණය ගැනීම්වලින් මූල්‍යනය කර තිබුණි. තවද, ලංවිමෙහි ස්කන්ධයට ණය අනුපාතය පසුගිය වසරේදී සියයට 64 සිට සමාලෝචනයට භාජනය වූ වර්ෂයේදී සියයට 88 දක්වා ඉහළ ගොස් තිබුණි.

#### 2.2.3 ලාභදායීත්වය

--------------

2017 වර්ෂයේ රු.20.34 ක් වූ ඒකකයක සාමාන්‍ය පිරිවැයට සාපේක්ෂව සමාලෝචනයට භාජනය වූ වර්ෂයේ රු.19.12 ක් වූ අතර, ඒකකය රු.16.29 ක් වූ සාමාන්‍ය මිලකට අලෙවි විය. (පෙර වසරේ සාමාන්‍ය විකුණුම් මිල ඒකකයකට රු.16.26 ක් විය). ඒ අනුව, සමාලෝචනයට භාජනය වූ වර්ෂයේ ඒකකයක දළ අලාභය රු. 2.83 ක් වූ අතර එය පසුගිය වසරේ සාමාන්‍ය ඒකකයක දළ අලාභය රුපියල් 4.08 හා සසඳන විට සියයට 31 ක අඩුවීමකි. පහත වගුවෙන් පෙර වර්ෂයට සාපේක්ෂව සමාලෝචනයට භාජනය වූ වර්ෂය තුළ අයක්‍රම කාණ්ඩ යටතේ විකුණන ලද විදුලි ඒකකයකට (kWh) දායකත්වය පෙන්නුම් කරනු ලබයි.

| අයක්‍රම කාණ්ඩය | ඒකකයකට දායකත්වය (kWh) | |
| --- | --- | --- |
| | **2018**<br>රු. | **2017**<br>රු. |
| ගෘහස්ථ | (5.52) | (6.86) |
| ආගමික | (11.84) | (13.13) |
| පොදු අරමුණ | 4.66 | 3.40 |
| හෝටල් | (1.50) | (2.61) |
| කර්මාන්ත | (4.40) | (5.57) |
| රජය | (0.89) | (2.08) |
| LECOතොග සැපයුම් | (3.59) | (4.55) |
| වීදි ආලෝකකරණය | (19.12) | (20.34) |
| **දායකත්වය** | **(2.83)** | **(4.08)** |

ඒ අනුව, සමාලෝචිත වර්ෂයේදී පොදු අරමුණ කාණ්ඩයේ අයක්‍රමය පමණක් මුළු දායකත්වය සඳහා ධනාත්මක දායකත්වයක් දක්වා තිබුණි. සමාලෝචනයට භාජනය වූ වසරේ සමස්ත දායකත්වය සඳහා ඉහළම සෘණාත්මක දායකයන් වූයේ කාර්මික හා දේශීය කාණ්ඩයේ අයක්‍රම වන අතර ආගමික, හෝටල්, රජය, ලෙකෝ වෙත විකිණීම සහ වීදි ආලෝකරණය යන ගාස්තු ද අහිත කර දායකත්වයක් පෙන්නුම් කර තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### (i) විදුලිබල උත්පාදනය සහ සෘජු පිරිවැය (බෙදා හැරීම් සහ සම්ප්‍රේෂණ හැර)

ලංවිමෙහි ප්‍රධාන පරමාර්ථය අඩු වියදමකින් රටට විදුලිය සැපයීමවුවත්, බලශක්ති මිලදී ගැනීමේ ගිවිසුම්වල අහිතකර කොන්දේසි, තාප විදුලිය උත්පාදනය සඳහා අධික පිරිවැයක් දැරීම සහ සුළං සහ සාම්ප්‍රදායික නොවන පුනර්ජනනීය බලශක්ති ප්‍රභවයන්ගෙන් දායකත්වය අඩුවීම යන හේතූන් මත අරමුණ සාක්ෂාත් කර ගැනීමට නොහැකිවී ඇත.

තවද, ලංවිමෙහි දිගුකාලීන උත්පාදන සැලැස්මට සහ සම්ප්‍රේෂණ සැලැස්මට ඇතුළත් කර ඇති ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කිරීමේදී සැලකිය යුතු ප්‍රමාදයන් නිරීක්ෂණය විය. එහි ප්‍රතිඵලයක් වශයෙන්, ලංවිම විසින් හදිසි විදුලි මිලදී ගැනීම් සිදු කර ඇති අතර එය ලංවිමෙහි අවම පිරිවැය පරමාර්ථයට අහිතකර ලෙස බලපා ඇත.

2018 වසරේ විදුලිබල උත්පාදන තත්ත්වය පෙර වසරට සාපේක්ෂව පහත දැක්වේ.

| මූලාශ්‍රය | 2018 ගි.වො. පැය | 2017 ගි.වො. පැය | වැඩිවීම/(අඩුවීම) ගි.වො. පැය | % |
|---|---|---|---|---|
| ජල විදුලිය | 6,381 | 4,004 | 2,377 | 59 |
| තාප | 3,629 | 5,045 | (1,416) | (28) |
| ගල් අඟුරු | 4,764 | 5,103 | (339) | (7) |
| සුළඟ | 326 | 367 | (41) | (11) |
| සාම්ප්‍රදායික නොවන පුනර්ජනනීය බලශක්තිය | 185 | 152 | 33 | 22 |
| වහල මත සූර්ය | 88 | - | 88 | - |
| **මුළු එකතුව** | **15,373** | **14,671** | **702** | **5** |

ඒ අනුව, සමාලෝචනයට භාජනය වූ වර්ෂය තුළ තාප හා සුළං බලශක්ති මිලදී ගැනීම පිළිවෙලින් සියයට 28 සහ සියයට 11 කින් අඩු වී ඇති අතර රටේ කාලගුණ තත්ත්වය වාසිදායකවීම හේතුවෙන් ජල විදුලි උත්පාදනය සියයට 59 කින් ඉහළ ගොස් තිබේ.

**(ii) ඍජු පිරිවැය**

පෙර වර්ෂයට සාපේක්ෂව 2018 වර්ෂයේ ඍජු පිරිවැය පිළිබඳ ප්‍රභව වශයෙන් විශ්ලේෂණය පහත දැක්වේ.

| විස්තරය | 2018 | | 2017 | |
|---|---|---|---|---|
| | රු.මිලියන | ප්‍රතිශතය | රු.මිලියන | ප්‍රතිශතය |
| ඉන්ධන | 41,553 | 21 | 57,842 | 27 |
| ගල් අඟුරු | 38,823 | 20 | 37,505 | 18 |
| විදුලිය මිලදී ගැනීම | 84,497 | 44 | 89,254 | 42 |
| මෙහෙයුම් සහ නඩත්තු | 13,812 | 7 | 11,727 | 6 |
| ක්ෂයවීම | 14,744 | 8 | 14,476 | 7 |
| **ඍජු පිරිවැය** | **193,429** | **100** | **210,804** | **100** |

ඉහත තොරතුරු වලට අනුව, ජල විදුලි උත්පාදනය සියයට 59 කින් ඉහළ ගොස් ඇති අතර, එහි ප්‍රතිඵලයක් ලෙස 2018 වර්ෂය සඳහා බලශක්ති මිලදී ගැනීම් සහ ඉන්ධන පිරිවැය රු.මිලියන 4,757 කින් සහ රු.මිලියන 16,289 කින් එනම් පෙර වර්ෂයට සාපේක්ෂව පිළිවෙලින් සියයට 5 සහ සියයට 28 කින් අඩු වී තිබුණු අතර සමාලෝචනයට භාජනය වූ වර්ෂය තුළ ව්‍යාපෘතියේ මෙහෙයුම් හා නඩත්තු පිරිවැය සියයට 11 කින් වැඩි වී තිබුණි. තවද, විදුලිබල මිලදී ගැනීමේ ගිවිසුම්වල කොන්දේසිවල සඳහන් විදුලිබල උත්පාදනය සඳහා වන ස්ථාවර පිරිවැය වැළැක්විය නොහැකිවීම හේතුවෙන් අවම පිරිවැය යටතේ සාමාන්‍ය ජනතාවට විදුලිය සැපයීම වන වැදගත්ම අරමුණු සාක්ෂාත් කර ගැනීමට ලංවීමට නොහැකි වී ඇත.

## 3.1 අනාර්ථික ගනුදෙනු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මෙගාවොට් 1 විදුලි ජනන යන්ත්‍ර (Transportable Generators) 50 ක් ප්‍රසම්පාදනයේදී (ඇස්තමේන්තුගත වටිනාකම රු.බිලියන 3) සැලකිය යුතු ප්‍රමාදයක් (2016 අප්‍රේල් සිට 2019 මැයි දක්වා) නිරීක්ෂණය වූ අතර, අමාත්‍ය මණ්ඩල සංදේශයේ සඳහන් ප්‍රධාන අරමුණට බාහිරව විදුලි ජනන යන්ත්‍ර භාවිතය සිදු කර තිබුණි. තාක්ෂණ ඇගයීම් කමිටුව විසින් අනුමත කරන ලද සමහර පිරිවිතරයන් ප්‍රසම්පාදන කමිටුව විසින් නොසලකා හැර තිබූ හෙයින් විදුලි ජනන යන්ත්‍ර මෙහෙයුම් පහළ මට්ටමක විය. | 2017-10-16 දිනැති ප්‍රසම්පාදන කමිටුවෙහි (SCAPC) සහ කැබිනට් සංදේශ අංක 17/2363/727/050 / TBR හි උපදෙස් අනුව මෙගාවොට් 1 ක බහාලුම් ගත ප්‍රවාහනය කළ හැකි විදුලි ජනන යන්ත්‍ර 50 ක්, බහාලුම් සහිත ට්‍රාන්ස්ෆෝමර් 25 ක්, බහාලුම් ගත ඉන්ධන ටැංකි 25 ක් ප්‍රසම්පාදනය කර ඇත.<br><br>ඒ අනුව, එක් එක් පාර්ශවයන් එකඟ වූ යම් යම් වැඩිදියුණු කිරීම් සමඟ ටෙන්ඩර් ලේඛනයේ දක්වා ඇති පිරිවිතරයන්ට අනුව ඩීසල් උත්පාදන (ඩීජී) කට්ටල ලැබුණි.<br>2019 ජනවාරි 25 වන දින තුල්හිරිය (1 මෙ.වො. x10) සහ කොලොන්නාව වැඩබිම 01, (1 මෙ.වො. x10) සහ කොලොන්නාව වැඩබිම 02 (1 මෙ.වො. x10) පිළිවෙලින් මාර්තු 22 සහ 26 යන දිනවල වාණිජ මෙහෙයුම් සඳහා විදුලි ජනන යන්ත්‍ර සවි කර ක්‍රියාත්මක කරන ලදි. අප්‍රේල් 7 වන දින මතුගම (1 මෙ.වො. x12) සහ 2019 මැයි 2 වන දින මතුගම (1 මෙ.වො. x8) ස්ථාපනය කරන ලද ඩීසල් ජෙනරේටර් කට්ටල ක්‍රියාත්මක වේ. කොන්ත්‍රාත්තුව අනුව කොන්ත්‍රාත්කරු, ක්‍රියාත්මක කිරීමේදී මුහුණ දෙන මෙහෙයුම් සහ නඩත්තු ගැටළු වලට සහභාගී වේ.<br>අසමත් වීමට මූලික හේතුව සොයා ගැනීම සඳහා අසාර්ථකත්වයන් පිළිබඳ තාක්ෂණික විශ්ලේෂණයන් අසාර්ථක වීමට හේතු දක්වමින් කොන්ත්‍රාත්කරු විසින් ලබා දී නොමැත. මේ දක්වා සමහර අසාර්ථක විශ්ලේෂණ වාර්තා සපයා ඇති අතර, බිඳවැටීම් නිවැරදි කර ඇත. සියලු ජනක ජෙනරේටර් කට්ටල 50 සඳහා ප්‍රාදේශිය පවරා ගැනීමේ සහතික නිකුත් කර ඇත. | ප්‍රධාන ප්‍රාග්ධන වත්කම් මිලට ගත් විට, ශක්‍යතා අධ්‍යයනයක් කළ යුතු අතර<br>අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා තාක්ෂණි පැති කෙරෙහි වැඩි අවධානයක් යොමු කළ යුතුය. |

## 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (අ) සමාලෝචිත වර්ෂය තුළ රු.1,931,142,380 ක මුදලක් ගල් අඟුරු තොග ඌනතාවය ලෙස දක්වා තිබුණි. කෙසේ වුවද, සමීක්ෂණ මණ්ඩල කණ්ඩායමක් පත්කර තිබුණද, භෞතික තොග ගණන් ගැනීමක් සිදුකර නොතිබුණි. එබැවින් 2018 දෙසැම්බර් 31 දිනට තිබුණු ගල් අඟුරු තොග ශේෂය පිළිබඳ නිරවද්‍යතාවය පරීක්ෂා කිරීමට නොහැකි විය. | පීපීඑම් (එල්වීපීපී) විසින් පත් කරන ලද සත්‍යාපන කණ්ඩායමම විසින් 2018-12-31 වන විට තහවුරු කරන ලද ගල් අඟුරු තොගය සහ සත්‍ය තොග ලැබීම් සහතික පත්‍ර අනුව නිකුත් කල ප්‍රමාණ 2018-12-14 සිට 2018-12-31 දක්වා එම ශේෂයට ගලපන ලදි. භෞතික තොගයට අනුව ලෙජරය ගලපා ඇත. | තොගය ලැබීමේදී මැනීම සඳහා ක්‍රියා පටිපාටි ස්ථාපිත කළ යුතු අතර වසර අවසානයේ තොගය භෞතිකව සත්‍යාපනය කළ යුතුය. |
| (ආ) ලංකා විදුලිබල මණ්ඩලය විසින් වර්ෂ ගණනාවක් ලංකා විදුලි (පෞද්ගලික) සමාගමට විදුලි බලය විකිණීම හා ලංකා ඛනිජ තෙල් සංස්ථාවෙන් ඉන්ධන මිලදී ගැනීම සිදුකර තිබුණද, එම ආයතන දෙක සමඟ මෙහෙයුම් පහසුවෙන් ක්‍රියාත්මක කිරීම තහවුරු කර ගැනීම සඳහා විකුණුම් හා මිලදී ගැනුම් ගිවිසුම්වලට එළඹ නොතිබුණි. | මණ්ඩලය විසින් ලෙකෝ වෙත විදුලිය විකිණීම සහ ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවෙන් ඉන්ධන මිලදී ගැනීම වසර ගණනාවක් තිස්සේ සිදුකර ඇතත්, එම පාර්ශව දෙක සමඟ විකුණුම් හා මිලදී ගැනීමේ ගිවිසුම්වලට එළඹී නොමැත.<br><br>ලංවිම හා ලෙකෝ යන දෙපාර්ශවයේම ඉහළ නිලධාරීන්ගේ සහභාගීත්වයෙන් යුත් කමිටුවක් මගින් කෙටුම්පත් ගිවිසුමක් සකස් කර ඇති අතර ඒ පිළිබඳව නීතිපතිවරයාගේ මතය විමසා ඇත. මෙම කමිටුව නීතිපතිවරයාගේ මතය අනුව අවශ්‍ය සංශෝධන සිදු කර ඇති අතර "අවසාන බලශක්ති විකුණුම් ගිවිසුම" අ.සා.(සම්ප්‍රේෂණය) වෙත ඉදිරිපත් කර ඇත. ලංවිම සාමාන්‍යාධිකාරී, ලෙකෝ සාමාන්‍යාධිකාරී වෙත ලිපියක් යවා ඇත. එම ලිපිය මඟින් ලෙකෝහි අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමකදී මෙම කරුණ සලකා බලන ලෙස ලංවිම සාමාන්‍යාධිකාරී විසින් යෝජනා කරන ලදි. | මෙම ආයතන අතර ආරවුල් ඇතිවීම වැළැක්වීම සඳහා ගිවිසුමක් අත්සන් කළ යුතුය. |

| | | |
|---|---|---|
| | කෙසේ වෙතත්, 2017-08-29 දින මතක් කිරීමක් යවා තිබුණද, මේ සම්බන්ධයෙන් සිදුවී ඇති ලෙකෝ සිදු කල ක්‍රියාවලිය පිළිබඳව මේ දක්වා ලෙකෝ වෙතින් කිසිදු ප්‍රතිපෝෂණයක් ලබා ගැනීමට ලංවිම ට නොහැකි වී තිබේ. ලෙකෝ සහ ලංවිම අතර විදුලිබල මිලදී ගැනීමේ ගිවිසුම සකස් කිරීම සඳහා විදුලි වෙළඳාම පිළිබඳ විධිවිධාන අවශ්‍ය බව සඳහන් කරමින් ලෙකෝ විසින් මේ සම්බන්ධයෙන් 2018-07-24 දිනැති ලිපිය මගින් මජන උපයෝගිතා කොමිසම වෙත ලිපියක් යවා ඇත. | |
| (ඇ)කාලීනව අරමුදල් උපයෝජනය නොකිරීම හේතුවෙන් ලංකා විදුලිබල මණ්ඩලයේ විදේශ අරමුදල් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා දෙනු ලබන ණය වලින් බැඳීම් ගාස්තු ලෙස 2018 වර්ෂයේදී රු.125,736,811 ක මුදලක් ණය නියෝජිතායතනය විසින් අයකර ගෙන තිබුණි. කෙසේ වුවද ගණනය කිරීම් ලබා ගැනීමට නොතිබූ බැවින් එම බැඳීම් ගාස්තුවල නිරවද්‍යතාවය පරික්ෂා කළ නොහැකි විය. | බැඳීම් ගාස්තු සියලු ව්‍යාපෘති සඳහා පොදු වන අතර ණය ගිවිසුම්වල ඇති දැඩි ණය ගිවිසුම් හේතුවෙන් ව්‍යාපෘතිය නියමිත වේලාවට වුවද එය වළක්වා ගත නොහැක.<br><br>බැඳීම් සහ පොලී ගාස්තු කාලසටහනේ **පළමු ව්‍යාපෘති තුන සඳහා** ණයෙහි කොටසක් නොවන අතර භාණ්ඩාගාරය රජය වෙනුවෙන් බැඳීම් ගාස්තු දරයි. භාණ්ඩාගාරය විසින් දැනුම් දෙන තුරු එවැනි බැඳීම් ගාස්තු වාර්තා කිරීමට ලංවීමට හැකියාවක් නැත. මේ අනුව, භාණ්ඩාගාරයෙන් තොරතුරු ලබා නොගෙන සංඛ්‍යා සත්‍යාපනය කළ නොහැක.<br><br>ඉතිරි ව්‍යාපෘති සඳහා, ඊආර්ඩී ප්‍රකාශනයෙන් උපුටා ගත් පසු බැඳීම් ගාස්තු ගිණුම් පොත්වල සටහන් කර ඇත. බැඳීම් ගාස්තු මෙම ව්‍යාපෘති සඳහා වන ණය මුදලෙහි කොටසක් වන අතර ණය දෙන ආයතන විසින් ලබා දෙන ණය මුදල් ඊආර්ඩී ප්‍රකාශනවල පෙන්නා ඇත. කෙසේ වෙතත්, ව්‍යාපෘති අංශ ගිණුම්වල දක්වා ඇති සංඛ්‍යා සමහර ව්‍යාපෘති සඳහා විගණකවරුන්ගේ සංඛ්‍යා සමඟ නොගැලපෙන බව නිරීක්ෂණය විය. සමහර ව්‍යාපෘතිවල බහු | අතිරේක කැපවීම් ගාස්තු වළක්වා ගැනීම සඳහා සැලසුම් කර ඇති පරිදි ව්‍යාපෘති කටයුතු ක්‍රියාත්මක කළ යුතුය. |

| | | |
|---|---|---|
| | සංරචක හා කොටස් ඇති නිසාත්, විවිධ සංරචක / කොටස් හසුරුවනු ලබන්නේ ලංවිමෙහි විවිධ අංශයන් විසින් වීම මෙයට හේතුවක් විය. එබැවින් විගණක විසින් පෙන්වන ලද සංඛ්‍යා, ව්‍යාපෘතිවල විවිධ කොටස් ඒකාබද්ධ කරන ලද සමුච්චිත සංඛ්‍යාවක් විය හැකිය. | |
| (ඇ)විදුලි බල පිරියතයන් ඉදි කිරීමේ අඛණ්ඩ ප්‍රමාදය හා අවම පිරිවැයදායී දිගු කාලීන උත්පාදන සැලැස්ම විධිමත්ව ක්‍රියාත්මක කිරීමේ අඛණ්ඩ ප්‍රමාදයක් තිබු බැවින් 2018 වර්ෂයේදී ගිවොපැ 362 ක විදුලි බලය මිලදී ගැනීමට ලංකා විදුලි බල මණ්ඩලයට සිදුවී තිබුණි. තවද සීමාසහිත ලක්දනවි (පුද්ගලික ) සමාගම විසින් කෙරවළපිටිය මෙගාවොට් 300 ක එල්එන්ජී විදුලි බල පිරියත ඉදිකිරීම පිළිබඳව ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුගමනය නොකිරීම නිසා ලංකා විදුලි බල මණ්ඩලයට එරෙහිව අධිකරණ නඩුවක් ගොනුකර තිබුණි. | 2018 වර්ෂයේදී බලශක්ති හිඟය ගිගාවොට් පැය 362 ක් විය. නමුත් සත්‍ය වාර්තාවලට අනුව දළ උත්පාදනය ගිගාවොට් පැය 15,917 ක් වූ අතර ශුද්ධ උත්පාදනය 2018 දී ගිගාවොට් පැය 15,305 ක් විය. උත්පාදනය නොමැතිකම හේතුවෙන් 2018 වර්ෂය තුල සමස්ත බලශක්ති හිඟය ගිගාවොට් පැය 0.8 ක් පමණ විය. | අවම පිරිවැය අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා අවම පිරිවැය දිගු කාලීන උත්පාදන සැලැස්මට ලංවිම අනුකූල විය යුතුය. |
| (ඉ) උතුරු වසන්තය ව්‍යාපෘතිය යටතේ 2014 වර්ෂයේදී හඳුනා ගන්නා ලද රු.52,550,929 ක තොග ඌනතාවය සම්බන්ධයෙන් අභ්‍යන්තර විගණන අංශය විසින් 2017 අප්‍රේල් මාසයේදී විශේෂ විමර්ශනයක් සිදුකරන ලදි. කෙසේ වුවද, රු.52,550,929 කින් රු.6,220,885 ක් වූ ඌනතා මුදල සඳහා වගකිව යුතු නිලධාරියාට එරෙහිව මෙම වාර්තාවේ දිනය දක්වා කිසිඳු විනය පරික්ෂණයක් සිදුකර නොතිබුණි. තවද , අනෙක් | **තොග ඌනතාව (2014) - රු.46,330,071.90**<br>**යූ.පී. උදාර ගුණරත්න (පී. එෆ්. අංක: 37475)**<br><br>1) ගබඩා භාරකරුගේ වැඩ තහනම් කර ඇත. විනය පරීක්ෂණ ආරම්භ කර ඇති අතර එය ක්‍රියාත්මක වෙමින් පවතී. අධිකරණ තීන්දුව බලාපොරොත්තුවෙන් සිටීම (නඩු අංක B / 1164/15).<br>2) ව්‍යාපෘතියේ ද්‍රව්‍ය සම්බන්ධීකරණ නිලධාරියාට එරෙහිව විනය පරීක්ෂණයක් ආරම්භ කර ඇති අතර එය ක්‍රියාත්මක වෙමින් පවතී. | වංචා පිළිබඳ විමර්ශනය සැලකිය යුතු කාල සීමාවක් තුළ සිදු කළ යුතු අතර, ලංවිම වෙත සිදුවන පාඩු වළක්වා ගැනීම සඳහා විමර්ශන වාර්තාව මත වහාම විනය ක්‍රියාමාර්ග ගත යුතුය. |

නිලධාරියාට එරෙහිව මේ සම්බන්ධයෙන් 2015 වර්ෂයේදී අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් ත්‍රිකුණාමලය මහෙස්ත්‍රාත් අධිකරණයේ අධිකරණ නඩුවක් ( නඩු අංකය බී/1164/15 ) ගොනු කර තිබුණි. තවද, අධිකරණ නඩුව සම්බන්ධයෙන් වර්තමාන තත්ත්වය පිළිබඳව තොරතුරු විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

3) එකතුව රු.22,58480 ක් වන මුදල ලබාගෙන වංචාසහගත ලෙස ද්‍රව්‍ය ලබානොදීමට අදාලව රු. 28,231,000 ක් (සියයට 25 ක මණ්ඩල වියදම්) ඇතුලත්ව අයකර ගැනීම සඳහා ලංවිම නීති නිලධාරි විසින් රිවඩ්සන් ප්‍රොජෙක්ට්ස් (පුද්ගලික) සමාගමට ඉල්ලීම් ලිපියක් නිකුත් කර ඇත.

4) ගබඩා භාරකරු උදාර ගුණරත්න මහතාගේ ඉතිරි ශේෂයට එරෙහිව ගැලපීම් කිරීම සඳහා රු.8,538,845 ක මුදලක් හඳුනාගෙන ඇත. කෙසේ වෙතත්, මෙම ප්‍රතිසාධන ගැලපුම සත්‍යාපනය තවදුරටත් විමර්ශනය කර අවසන් කරනු ඇත.

5) මෙම අලාභයට එරෙහිව තවත් ගැලපීම් හඳුනා ගැනීම සඳහා තොග ද්‍රව්‍ය ගනුදෙනු පිළිබඳ පූර්ණ විමර්ෂණයක් සහිතව වැඩිදුර සත්‍යාපනය මේ වන විට කඩිනමින් සිදු කරනු ලැබේ. ඒ අනුව, මෙම අලාභයේ ණයගැතියාගේ ශේෂය තවදුරටත් අඩු වනු ඇත.

6) අභ්‍යන්තර විගණන ශාඛාව විසින් සිදු කරන ලද විශේෂ පරීක්ෂණයෙන් පසුව, සුදුසු වැළැක්වීමේ ක්‍රියාමාර්ග (නව ආරක්ෂක කැමරා පද්ධතියක් ස්ථාපනය කිරීම, ගබඩා වටා ඇති සමස්ත වැට අලුත්වැඩියා කිරීම, ගබඩාව පුරා නව ආරක්ෂක ආලෝකකරණ පද්ධතියක් ස්ථාපනය කිරීම, පුද්ගලික ආරක්ෂක කාර්ය මණ්ඩලය වෙනුවට ලංවිම ආරක්ෂක නිලධාරීන් යොදවා ගැනීම. ගබඩාවල තොග මට්ටම් විශාල ලෙස අඩු කිරීම සහ අවම තොග මට්ටමක් පවත්වා ගැනීම) මෙම ගබඩාවල අඛණ්ඩව යහපත් තොග කළමනාකරණය සහ පාලන පද්ධතියක් පවත්වාගෙන යාම සඳහා ගෙන ඇත.

7) ඉහත 3 වන වගන්තියේ දක්වා ඇති පාඩුව හැරුණු විට (එනම් රු.22,584,800), ගැලපුම් තහවුරු කිරීමෙන් පසු ඉතිරි අලාභ ද්‍රව්‍ය මුදල රු.23,745,272 සිට රු.15,150,417 දක්වා අඩු කෙරේ.

8) 7 වන සහ 3 වන වගන්තිවලට අනුව, උදාරා ගුණරත්නගේ අවසාන ණය ගැති ශේෂය රු.37,791,227 දක්වා විය හැක.

9) ව්‍යාපෘතියේ මුළු පිරිවැය රු.11,414,760,869 ක් වීම සහ මුළු ද්‍රව්‍යමය අලාභය රු. 37,791,227 කි. එබැවින් ව්‍යාපෘතියේ ද්‍රව්‍යමය අලාභයේ ප්‍රතිශතය සියයට 0.33 කි.

**තොග ඌනතාව (2015) - රු.6,220,855.50**

**අසංක ජයකොඩි මහතා (පී. එෆ්. අංක 37432)**

රු.4,212,810 ක් දැනටමත් නිෂ්කාශනය කර ඇත.

2017-05-04 දිනැති අංක එන්පී /ඩීජීඑම් /එච්ආර්ඕ / විමසීම් ලිපිය මගින් ඩීජීඑම් (එන්පී) විසින් පත් කරන ලද විමර්ශන කමිටුවේ තීරණය තෙක් ඉතිරි ශේෂය රු.2,008,045 ක පවතී. කමිටුවේ සභාපතිවරයාගේ වාර්තාව 2019-10-03 වන විට ඩීජීඑම් (එන්පී) වෙත ඉදිරිපත් කර ඇත. ඒ අනුව, රු.2,510,057 ක (පුවරු ගාස්තු ඇතුළුව) හිඟ මුදල ගබඩා භාරකරුගෙන් අයකර ගැනීමට ඩීජීඑම් (එන්පී) නිර්දේශ කර ඇත.

[J.A.M. අසංක ජයකොඩි මහතා (PF No.37432)] 2019-10-09 දිනැති අංක එන්පී /ඩීජීඑම් /එච්ආර්ඕ / විමසීම් යන ලිපිය හරහා.

| | | |
|---|---|---|
| (ඊ)වත්කම් කළමනාකරණ අංශයේදී (ජනන යන්ත්‍ර) 2006 නොවැම්බර් 20 සිට 2012 පෙබරවාරි 20 දක්වා කාලය තුළ සිදුවී ඇති රු. 3,674,861 ක ඌනතාවයන් සඳහා විධිමත් විමර්ශනයන් සිදුකර තිබුණද වගකිව යුතු පුද්ගලයන්ට එරෙහිව මණ්ඩලය විසින් 2018 අගෝස්තු 16 දක්වා විධිමත් පියවර ගෙන නොතිබුණි. තවද, එම සේවකයාම ලංවිම වෙනත් කාර්යාලයක වංචාවක් සිදු කර ඇති අතර, එම වංචාවේ වටිනාකම වූ රු.99, 155 පමණක් අය කර ගැනීමෙන් පසු පෙර වංචාවේ වටිනාකම අයකර ගැනීමෙන් තොරව ඔහුගේ රාජකාරිය අවසන් කර ඇත. | ඉහත ශේෂයට හේතු වී ඇත්තේ ගබඩා භාරකරුවන් දෙදෙනෙකු වන ආර් බී වෙදගෙදර මහතාගේ තොග ඌනතාවයි. මෙය විගණන කමිටුව වෙත යොමු කරන ලද අතර, 2019- 06-28 දිනවල පැවති රැස්වීමේදී ඉහත වංචාව සම්බන්ධයෙන් විගණන වාර්තාවේ ලැයිස්තුගත කර ඇති වගකිවයුතු නිලධාරීන් පිළිබඳව පරීක්ෂණයක් පවත්වන ලෙස කමිටුව විසින් ලංවිම සාමාන්‍යාධිකාරි වෙත නියම කර ඇත.. | වංචා පිළිබඳ විමර්ශනය සැලකිය යුතු කාල සීමාවක් තුළ සිදු කළ යුතු අතර, ලංවිම වෙත සිදුවන පාඩු වළක්වා ගැනීම සඳහා විමර්ශන වාර්තාව මත වහාම විනය ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (උ) වටිනාකම රු.3,789,893 ක් වූ තොග ඌනතාවය සඳහා විමර්ශනය කිරීම සඳහා පත්කළ කමිටුවේ නිර්දේශය පරිදි පාඩුව අයකර ගැනීමෙන් තොරව ඒ සඳහා වගකිව යුතු වූ නිලධාරියාට 2011 ඔක්තෝබර් 15 දින විශ්‍රාම යාමට ඉඩ සලස්වා තිබුණි. තවද , කිසිඳු නිවැරදි කිරීම් ක්‍රියාමාර්ගයක් ගැනීමෙන් තොරව , ඉහත ප්‍රමාණාත්මක මුදල ගිණුම් පොත්පත්වල පැවතුණි. | ඉහත ශේෂයට හේතු වී ඇත්තේ ගබඩා භාරකරු වන එන් පී එල් සමරසිංහ මහතාගේ තොග ඌනතාවයි. මෙය විගණන කමිටුව වෙත යොමු කරන ලද අතර, 2019-06-28 දිනවල පැවති රැස්වීමේදී ඉහත වංචාව සම්බන්ධයෙන් විගණන වාර්තාවේ ලැයිස්තුගත කර ඇති වගකිවයුතු නිලධාරීන් පිළිබඳව පරීක්ෂණයක් පවත්වන ලෙස කමිටුව විසින් ලංවිම සාමාන්‍යාධිකාරි වෙත නියම කළේය. | වංචා පිළිබඳ විමර්ශනය සැලකිය යුතු කාල සීමාවක් තුළ සිදු කළ යුතු අතර ලංවිම වෙත සිදුවන පාඩු වළක්වා ගැනීම සඳහා විමර්ශන වාර්තා මත වහාම විනය ක්‍රියාමාර්ග ගත යුතුය. |

## 3.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| රු.17,936,845,512 ක මුළු පරිභෝජනය කළ හැකි තොගයෙන් සියයට 11 ක් එනම් රු.2,051,605,881 ක මුදලක් 2018 දෙසැම්බර් 31 දින වන විට මන්දගාමී, චලනය නොවන හා හානියට පත් තොග ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇත. මෙම චලනය නොවන හා මන්දගාමී තොග පවත්වාගෙන යාම මඟින්, ගබඩා පිරිවැය සහ වංචා ආදිය වැඩි වීමට හේතු විය හැක. | මන්දගාමී චලනය, චලනය නොවන හා හානියට පත් ප්‍රතිශතයේ තොරතුරු පහත පරිදි වේ.<br>**ප්‍රතිශතය**<br>චලනය නොවන 05<br>මන්දගාමීව චලනය වන 04<br>හානියට පත් 02<br>11<br>බොහෝ තොග විනාශ නොවන ස්වභාවයක් ගන්නා අතර, ලංවිමෙහි මෙම තොග අයිතමයන් සහ අමතර කොටස් විදුලි උත්පාදනය, සම්ප්‍රේෂණය සහ බෙදා හැරීම සඳහා භාවිතා කරන තොග අයිතමයන් වේ. මෙම මන්දගාමී හෝ චලනය නොවන තොග ව්‍යාපාරයේ ස්වභාවය නිසා ඕනෑම හදිසි තත්වයක් සඳහා තොගයේ තබා ගත යුතු අතර තොග නැතිවීම වළක්වා ගත යුතුය. එබැවින් සියයට11න් සියයට නවයක්ම චලනය නොවන අතර මන්දගාමීව චලනය වන අතර එම තොග අයිතම මන්දගාමී හෝ චලනය නොවුවද බැහැර කල නොහැක. හානියට පත් තොග බැහැර කිරීම පිළිබඳ ක්‍රියා කිරීම (තොග වටිනාකමෙන් සියයට 2 ක් ලෙස) ඒකකයේ / ශාඛාවේ ප්‍රධානියා විසින් සිදු කරනු ලබන වාර්ෂික ක්‍රියාකාරකමකි. ගනු ලැබූ ක්‍රියාමාර්ග සහ වර්තමාන තත්ත්වය ඇමුණුම 05 හි දක්වා ඇත. | හානිය,අමතර ගබඩා පිරිවැය සහ වංචාවන්ට ඉඩ සැලසීම වැලැක්වීම සඳහා චලනය නොවන සෙමින් චලනය වන තොග අඩු කිරීමට ක්‍රියාමාර්ග ගත යුතුය. |

## 3.4 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) ලංකා විදුලිබල මණ්ඩලයේ බඳවා ගැනීමේ හා උසස් කිරීමේ යෝජනා ක්‍රමය දීර්ඝ කාලයක් තිස්සේ යාවත්කාලීන කර නොමැත. | සංශෝධිත යෝජනා ක්‍රමය 2016 ජුනි මාසයේදී මණ්ඩලයේ අනුමැතිය සඳහා ඉදිරිපත් කරන ලදි. සියළුම ලංකා විදුලිබල මණ්ඩලයේ වෘත්තීය සමිති අතර අදාල කෙටුම්පත ඔවුන්ගේ අදහස් හා යෝජනා සඳහා බෙදා හරින ලෙස මණ්ඩලය විසින් කළමනාකාරිත්වයෙන් ඉල්ලා ඇත. ඒ අනුව, වෘත්තීය සමිතිවල යෝජනා සලකා බැලීමෙන් පසු සමාලෝචනය කරන ලද යෝජනා ක්‍රමය, 2017 දී මණ්ඩලයට ඉදිරිපත් කරන ලදි. කෙසේ වෙතත්, මණ්ඩලය විසින් මෙම යෝජනා ක්‍රමය සමාලෝචනය කරන ලෙස කළමනාකාරිත්වයෙන් ඉල්ලා ඇති අතර ඒ අනුව කමිටුවක් පත් කරන ලදි. මෙම තත්වය අද දක්වාම පවතී. | බඳවා ගැනීමේ යෝජනා ක්‍රමය ඇති කිරීම සඳහා කඩිනම් පියවර ගත යුතුය. |
| (ආ) මානව සම්පත් අංශයේ ප්‍රධාන තනතුර නි.සා.(පිරිස්) වුවද, එම තනතුර සඳහා අවශ්‍ය සුදුසුකම් හා පළපුරුද්ද බඳවා ගැනීමේ හා උසස් කිරීමේ යෝජනා ක්‍රමයේ (SOR) නිශ්චිතව දක්වා නොතිබීම සහ විශේෂයෙන් විදුලි ඉංජිනේරු තනතුරු ඇතුලත්ව වෙනත් සේවාවන් සඳහා විවෘතව තබා ගැනීම. | මෙම කාරණය රාජ්‍ය ව්‍යාපාර පොදු සභාවේ දී ගනු ලැබූ අතර, එහි නිර්දේශයන් මත විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යාංශයේ ලේකම් විසින් පත් කරන ලද කමිටුව විසින් නි.සා. (පිරිස්) තනතුර නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි මට්ටමේ ජ්‍යෙෂ්ඨ විදුලි ඉංජිනේරුවරයෙකු විසින් දැරීම ඵලදායී බව අනාවරණය කර තිබේ. | දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සුදුසුකම් හා පළපුරුද්ද බඳවා ගැනීමේ යෝජනා ක්‍රමයට ඇතුළත් කළ යුතුය. |
| (ඇ) පවත්නා සේවකයින් බඳවා ගැනීමේ ක්‍රියාපටිපාටියට අනුව, මානව සම්පත් නිලධාරීන්ගේ (HRO) සමස්ත කාර්ය මණ්ඩලයෙන් සියයට 50 ක් බාහිරින් පුරවා ගන්නා අතර එම ප්‍රතිශතය වසරින් වසර ක්‍රමානුකූලව සියයට 85 දක්වා වැඩි කිරීමට සැලසුම් කර ඇත. කෙසේ වෙතත්, ලංවිම ඉතිහාසයේ දීර්ඝ කාලයක සිට ඉංජිනේරුවන් දෙදෙනෙකු අංශ ප්‍රධානියාගේ | ලංවිම යනු පූර්ණ ඉංජිනේරු ශිල්පය පදනම් කරගත් සංවිධානයක් බැවින්, සංවිධානයේ සහ ශ්‍රම බලකායේ ස්පන්දනය තේරුම් ගත හැකි ඉංජිනේරුවන් විසින් ප්‍රධාන තනතුරු දැරීම අත්‍යාවශ්‍ය වේ. එබැවින් පිරිස් ශාඛාවේ ඉහළම තනතුරු දෙක ඉංජිනේරුවන් විසින් දරනු ලබයි. ලංවිම, සාමාන්‍යාධිකාරි විසින් පවරා ඇති කාර්යයන් අනුව ආයතනික මානව සම්පත් කාර්යයන් කළමනාකරණය කිරීමේ වගකීම ඔවුන් වෙත පැවරීම ඊට හේතුවී ඇති | බාහිරව බඳවා ගන්නා සේවකයින් සඳහා පැහැදිලි උසස්වීම් මාර්ගයක් ලබා දීම සඳහා බඳවා ගැනීමේ යෝජනා ක්‍රමය සංශෝධනය කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | කාර්යයන් ආවරණය කරන නිසා උසස්වීම් යෝජනා ක්‍රමයේදී බාහිරව බඳවා ගන්නා සේවකයින් සඳහා පැහැදිලි ප්‍රවර්ධන මාර්ගයක් පවතින බව නිරීක්ෂණය නොවිනි. | බැවිනි. මෙම ඉංජිනේරුවන් දෙදෙනා සාමාන්‍යාධිකාරි විසින් පවරා ඇති කාර්යයන් හා යුතුකම් ඉටු කරති. එබැවින් මානව සම්පත් ක්ෂේත්‍රයේ සිටින නිලධාරීන්ගේ උසස්වීම් සඳහා මෙම තනතුරු බාධාවක් වී නොමැත. මෙම තනතුරු දෙකේ වැදගත්කම තවදුරටත් සලකා බලමින්, මානව සම්පත් කළමනාකරණ පිළිබඳ පශ්චාත් උපාධි සුදුසුකම් ලබා ඇති ඉංජිනේරුවරයෙකු මෙම තනතුරු දෙකෙන් එක් තනතුරක් සඳහා පත් කිරීම ලංවිම, සාමාන්‍යාධිකාරි මැතකදී සිදු කර ඇත. | |
| (ඇ) | මානව සම්පත් කළමනාකරු සහ මානව සම්පත් නිලධාරී සෘජුවම බඳවා ගැනීම සඳහා අවශ්‍ය පළපුරුද්ද සේවකයින් 100 කට වැඩි සංඛ්‍යාවක් සිටින ආයතනයක මානව සම්පත් ක්ෂේත්‍රයේ වසර 06 කි. ලංවිම තුළ කාර්ය මණ්ඩල ශක්තිය හැසිරවීම සඳහා ඉහත අත්දැකීම් ප්‍රමාණවත් නොවන බව නිරීක්ෂණය කෙරේ. | අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කරන ලද සංශෝධිත බඳවා ගැනීමේ හා උසස් කිරීමේ යෝජනා ක්‍රමය කෙටුම්පත තුල විසඳී ඇත. | සංශෝධිත බඳවා ගැනීමේ යෝජනා ක්‍රමය සඳහා අනුමැතිය වහාම ලබා ගත යුතුය |
| (ඉ) | ප්‍රධාන නීති නිලධාරී සහ විදුලි ඉංජිනේරු (ඩීසීසී) එන්.සී.පී. යන ප්‍රධාන තනතුරු දෙකක් දිගු කාලය සිට පුරප්පාඩු වී ඇත. | ප්‍රධාන නීති නිලධාරී පුරප්පාඩුව පිරවීම සඳහා පත්තර දැන්වීමක් මගින් අයදුම්පත් කැඳවීමට කටයුතු යොදා ඇත. නව විදුලි ඉංජිනේරු බඳවා ගැනීම අවසන් වූ පසු විදුලි ඉංජිනේරු (ඩීසීසී) එන්.සී.පී පුරප්පාඩුව පුරවනු ඇත. | සංවිධානයේ මෙහෙයුම් ඵලදායීව හා කාර්යක්ෂමව පවත්වා ගැනීම සඳහා කෙටි කාලයක් තුළ ප්‍රධාන තනතුරු පිරවිය යුතුය. |